# වාර්ෂික වාර්තාව
# 2015

## <u>අපගේ දැක්ම</u>

නව ලොව සමඟ අනුගත

වෙමින්

කෘෂි ව්‍යවසායකයන් බිහි කරන

ජාත්‍යන්තර තත්ත්වයේ

තාක්ෂණ විශ්ව විද්‍යාලයක්

බවට පත්වීම.

## <u>අපගේ මෙහෙවර</u>

ශ්‍රී ලංකාවේ දැනුමින් සපිරි කෘෂි ආර්ථිකයක් බිහි කිරීම සඳහා තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යාවන් භාවිතා කරමින් ව්‍යවසායකත්වය අරමුණු කරගත් උපාධිධාරීන් සහ මානව සම්පත් බිහි කිරීම.

**අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය:**

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික රටක් වන අතර, ග්‍රාමීය ජනතාවගෙන් බහුතරය ඔවුන්ගේ ජීවනෝපාය ලෙස ගොවිතැන් කටයුතුවල නිරත වේ. එසේ වුවත්, කෘෂිකාර්මික අංශය තුළ අඩු ඵලදායිතාව සහ වාණිජ මට්ටමකින් අගය එකතු කළ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි අඩු අවධානය යොමු කිරීම හේතු කොට ගෙන, මෙරට තවමත් දේශීය අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආනයනය කළ ආහාර ද්‍රව්‍ය මත රඳා පවතී. මෙම තත්ත්වයට බලපෑ ප්‍රධාන සාධකවලින් එකක් වන්නේ පාර්ශ්වකාර දාමය තුළ විශේෂයෙන් ගොවි ප්‍රජාව තුළ පවත්නා දැනුම් පරතරය යි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) දැක්ම වන්නේ දැනුම සහ අධ්‍යාපනය වැඩි කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදනය තුළ ස්වයං-පෝෂණය සඳහා අවසාන වශයෙන් මෙහෙයවන දැනුම හුවමාරු කිරීම සඳහා සංසදයක් නිර්මාණය කිරීම තුළින් ගොවි ප්‍රජාව පෝෂණය කිරීමේ අදහසින් ප්‍රයෝජනවත් ලෙස මෙම දැනුම් පරතරය සම්පූර්ණ කිරීමයි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය සීමාමායිම්වලින් බැහැර වූ දැක්මක් ඇති පළමු විශ්ව විද්‍යාලයීය ආයතනය වන අතර, රට තුළ කෘෂි-ව්‍යවසායකයින් සඳහා ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා සහ කෘෂි තාක්ෂණික උපාධි පිරිනමයි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් පිරිනමන මාර්ගගත පාඨමාලා මෙරට විශ්ව විද්‍යාලවල පවත්නා සම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ ආකර්ෂණයට ලක්වී ඇති අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ දැනුම් පරතරය අවම කිරීමට සහ තිරසාර කෘෂිකර්මයක් සඳහා සහය වේ.

ගොවිපල ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින්, කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය උසස් තත්ත්වයේ පටක රෝපණ කෙසෙල් පැළ සහ වෙනත් රෝපණ ද්‍රව්‍ය ගොවි ප්‍රජාව වෙත ලබා දේ. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ තවත් එක් වැදගත් සංධිස්ථානයක් වන්නේ දිළිඳුකම තුරන් කිරීම සඳහා රජයේ වැඩපිළිවෙල ශක්තිමත් කරමින්, අපනයන අරමුණ සඳහා අඹ ප්‍රවර්ධනය කිරීම (Tom-EJC) සඳහා එහි තාක්ෂණික යෙදවුම් සැපයීමයි.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ලෙස, 'පළමුව ගුණාත්මකභාවය' යන ආදර්ශ පාඨය පවත්වා ගනිමින් අපගේ ගමන් මාර්ගයේ සෑම පියවරකදී ම අපගේ උප කුලපති විසින් අප වෙත ලබා දුන් විශිෂ්ට සහයෝගය සහ උපදේශනය සම්බන්ධයෙන් මම හෘදයාංගම කෘතඥතාව පළ කරමි. එමෙන් ම කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කුමන ආකාරයකින් ම හෝ දායක වූ ඔබ සියලු දෙනා වෙත ද මාගේ ස්තුතිය පිරිනමමි.

එම්.ඩී. පියතිලක
අධ්‍යක්ෂ/කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

**2015 වසරේ විශේෂ සිදුවීම්**

- කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථක අයුරින් සම්පූර්ණ කරනු ලැබූ 2 වන සහ 3 වන කණ්ඩායම් සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය හම්බන්තොට, මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (MRICC) 2015 ජූනි මස 03 දින පැවැත්වීම.

- 2015.08.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස එන්.පී. විදානපතිරණ මහත්මිය පත්කරමින් කෘෂි-තාක්ෂණික දෙපාර්තමේන්තුව පිහිටුවීම.

- කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය වෙතින් කොළඹ විශ්ව විද්‍යාලය වෙත තාක්ෂණික විෂය ධාරාව මාරු කිරීම.

- කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය අයි.එම්.කේ.ප්‍රනාන්දු මහතාගේ උපදේශකත්වයෙන් වෙනෝරා ටෙලිකොම් පුද්ගලික සමාගම විසින් නව නේවාසිකාගාරය (නේවාසිකාගාර ව්‍යාපෘතිය 60 යටතේ) සඳහා සර්පන ආරක්ෂක සහිතව අකුණු ආරක්ෂක පද්ධතියක් ස්ථාපනය කිරීම.

- කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ සිසුන් වෙත නේවාසිකාගාර පහසුකම් ලබාදීම සඳහා 2015 සැප්තැම්බර් 18 දින සිව් මහල් නව නේවාසිකාගාරය (නේවාසිකාගාර ව්‍යාපෘතිය 60 යටතේ) විවෘත කිරීම.

## පටුන

පිටු


1. සමාලෝචනය

1.1 හැඳින්වීම 04

1.2 කළමනාකරණ මණ්ඩලය 05

1.3 කළමනාකරණ මණ්ඩල රැස්වීම 05

1.4 සංවිධාන ව්‍යුහය 07

2. සමස්ථ කාර්යසාධනය 08

2.1 අධ්‍යයන අංශයේ කාර්යසාධනය 10

2.2 ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් හි කාර්යසාධනය 17

2.3 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය 20

3. පර්යේෂණ හා නවෝත්පාදන 27

4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය 27

5. අලුත්වැඩියා කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති 28

6. මූල්‍ය 29

6.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

6.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

6.3 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශිය/ විදේශීය අරමුදල්)

6.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර ( ඉපයූ ආදායම)

6.5 2015-මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

6.6 2015 වසර සඳහා ලද යටිතල පහසුකම් පිළිබඳ විස්තර

6.7 2015 වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

6.8 2015 විගණකාධිපති වාර්තාව

6.9 2015 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

## 1. සමාලෝචනය

### 1.1 හැඳින්වීම

මෙම ආයතනය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධව හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්‍ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව සහයෝගයෙන් වැඩකරමින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකරන්නේ කෙසේ ද? යන්න පිළිබඳ ව සහ කලාපයේ කෘෂි තාක්‍ෂණය හා කෘෂි කර්මාන්තය පිළිබඳ ව ද දැනුම හා තාක්‍ෂණය හුවමාරු කර ගැනීමට සමත් වී ඇත. මෙම ආයතනයේ නිර්මාතෘ වන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපතිනි සහ හිටපු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනී වන මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය යි.

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 24 'අ' වගන්තිය සහ 2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්‍ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම නියමාවලිය 2008 අගෝස්තු මස 23 වැනි දින සිට බලාත්මක වන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලය මගින් පිරිනමන කෘෂි තාක්ෂණ උපාධියට සමගාමීව කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය කෘෂි තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා ලෙස පවත්වාගෙන යනු ලබයි.

කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම සියලු පාඨමාලා ගොවි ප්‍රජාව තුළ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන බාධා වන වයස, ඉඩ ප්‍රස්ථාව, කාලය සහ අධ්‍යයන පරිසරය යන සාධක මඟ හරවමින් සාර්ථකව දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ඉහත කී අධ්‍යාපන අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත. මෙම ආයතනය කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීම තුළින් වර්තමානයේ කෘෂි තාක්ෂණය සහ කෘෂි කර්මාන්තය පිළිබඳ ව ප්‍රජාව අතර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සිදුකර ඇත. එය ගොවි ප්‍රජාවගේ උසස් අධ්‍යාපනයට දොරටු විවෘත කිරීමේ සිහිනය සැබෑ කරමින් ඔවුන්ගේ නිවසටම දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ අධ්‍යාපනය ගෙන යමින් සමාජීය අවශ්‍යතා ඉටු කිරීමට සහ පුද්ගල වෙනස්කම් ඉටු කිරීමට හා ඔවුන්ගේ ඕනෑ එපාකම් පිරිමැසීමට සමත් වන්නේය. නමුත් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට ඇති කැමැත්ත හෝ බලාපොරොත්තුව ඔවුන්ගේ පෞද්ගලික, ආර්ථික හෝ පවුල් පසුබිම හේතුවෙන් ගිලිහී යන අවස්ථාවන් දක්නට ඇත. මෙම ආයතනය දුප්පත් ගොවි ප්‍රජාවගේ වැඩිදුර අධ්‍යාපනය ලබන්නන්ට තම පාඨමාලා තෝරා ගැනීමට හා එම අවස්ථාවලට ප්‍රවේශ වීමට ඇති හැකියාව වැඩිදියුණු කරමින් නවීණ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් ඔවුන්ගේ අධ්‍යාපන යථාර්තය හා වෘත්තීය සමාජ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට සුදුසු තෝතැන්නක් බවට පත්කර ඇත.

එපමණක් නොව මෙම ආයතනය විවිධ වැඩසටහන්වලට අමතරව ඉතාමත් සාධාරණ මිලකට දේශීය ගොවි ප්‍රජාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදන ලබා දීමට කටයුතු කරමින් ආයතනයේ ආදායම් උත්පාදනය කිරීමට ද සමත් වී ඇත. මේ මොහොත වන විට පටක රෝපණ විද්‍යාගාර 03 ක් සහ ප්‍රධාන දැල් ගෘහ 03 ක් ඉදිකර ඇත. සෑම මසකම සියළුම විද්‍යාගාර සහ දැල් ගෘහයන් තුන භාවිත කරමින් පටක රෝපණ කෙසෙල් පැළ 15000- 20000 ත් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කරයි. මෙම ආයතනය දිවයින පුරා විසිරී සිටින ග්‍රාමීය ගොවි ජනතාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයක්

පවත්වා ඇත. එසේම ග්‍රාමීය විද්‍යාවන්ට සම්බන්ධ නව තාක්ෂණය ගැන ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා එම සම්පත් භාවිත කරමින් විවධ ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

## 1.2 කළමනාකරණ මණ්ඩලය

2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 05 වන වගන්තිය ප්‍රකාරව කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය තම කළමනාකරණ මණ්ඩලය පිහිටුවා ඇති අතර උක්ත නියමාවලියේ 10 වගන්තිය ප්‍රකාරව එකී කළමනාකරණ මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වන අතර එය පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

නිළ බලයෙන් පත්වන සාමාජිකයින් 05 කි.

(අ). අධ්‍යක්ෂ , සභාපති/සභාපතිනිය වියයුතුය.
(ආ). නියෝජ්‍ය අධ්‍යක්ෂ
(ඇ). උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ අමාත්‍යංශ ලේකම් හෝ විෂයභාර ලේකම් හෝ එකී අමාත්‍යංශයේ උසස් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් නම් කරන ලද සාමාජිකයෙකු
(ඈ). කෘෂිකර්ම විෂයභාර අමාත්‍යංශයේ අමාත්‍යංශ ලේකම් හෝ එකී අමාත්‍යංශය විසින් නම් කරන ලද සාමාජිකයෙකු සහ
(ඉ). විශ්ව විද්‍යාලයේ විද්‍යා අධ්‍යනාංශයේ පීඨාධිපති

අනෙකුත් සාමාජිකයින් 06 කි.

(අ). කෘෂි ව්‍යාපාර කර්මාන්ත හා කෘෂි තාක්ෂණය නියෝජනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් දෙදෙනෙක්
(ආ). පාලක සභාවේ සාමාජිකයින් අතරින් පත්කරගන්නා සාමාජිකයින් දෙදෙනෙක්,
(ඇ). හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද සාමාජිකයෙකු, සහ
(ඈ). ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත්කර ගන්නා සාමාජිකයෙකු වශයෙන් වේ.

## 1.3 කළමනාකරණ මණ්ඩල රැස්වීම්


ආයතනයේ කළමනාකරණ මණ්ඩලය අධ්‍යයන සහ පරිපාලන කරුණු පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා වසර තුළ දී විධිමත්ව රැස්වී ඇත. කළමනාකරණ මණ්ඩලය 2015 වසර තුළ හය වරක් (06) රැස් වී ඇත.

2015 දී කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| **නිල බලයෙන් පත්වූ සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)** | | |
| | අධ්‍යක්ෂ- සභාපති | එම්.ඩී. පියතිලක මහතා |
| | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නම් කළ තැනැත්තා | ඒ.එස්.පී. වීරසූරිය මහත්මිය |
| | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් නම් කළ තැනැත්තා | ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන |
| | විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම |
| **අනිකුත් සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)** | | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නම් කළ තැනැත්තා | මහාචාර්ය තාරා ද සිල්වා මහත්මිය |
| | | ක්‍රිෂාන්ති වීරසිංහ මහත්මිය |
| | පාලක මණ්ඩලයේ නියෝජිතයන් | රජන් ආශිර්වාදම් මහතා |
| | | මහාචාර්ය ලක්ෂ්මන් රත්නායක මහතා |
| | දිස්ත්‍රික් ලේකම්/ හම්බන්තොට | ආර්. සී. ද සොයිසා මහතා |
| **ආරාධිත/කැඳවන ලද** | | |
| | කෘෂි තාක්ෂණික දෙපාර්තමේන්තුවේ ප්‍රධානී | එන්.පී.එන්. විදානපතිරණ මහත්මිය |
| | සහකාර මූල්‍යාධිකාරී | ඒ.ඒ.එස්.සී. උබේසිංහ මහත්මිය |
| | පැළ තවාන් අංශ භාර නිලධාරී | එච්.රෝහණධීර මහතා |
| | විද්‍යාගාර අංශ භාර නිලධාරී | එස්.වී.ජී.එන්.ප්‍රියදර්ශනී මෙනෙවිය |
| **ලේකම්** | | |
| | සහකාර ලේඛකාධිකාරී | එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය |

වගුව **01**

**1.4 සංවිධාන ව්‍යුහය**


කළමනාකරණ මණ්ඩලය
ශාස්ත්‍රීය මණ්ඩලය
අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයේ
සනාථන සභාවේ සාමාජිකයෙක්
පරිපාලන අංශය
මුදල් අංශය
අධ්‍යයන දෙපාර්තමේන්තු
අධ්‍යයන මණ්ඩලය
මධ්‍යස්ථාන
කෘෂි-තාක්ෂණය
ආහාර- තාක්ෂණය
ව්‍යවසායකත්ව කෘෂි-ව්‍යාපාර හා ග්‍රාමීය විද්‍යාවන්
පර්යේෂණ හා උසස් උපාධි
අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහන්
බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන්
කෘෂි ව්‍යාපාර සහ කර්මාන්ත කවය
විද්‍යා උයන
ව්‍යාප්ති වැඩසටහන්

## 2. සමස්ත කාර්යසාධනය


මෙම ආයතනය, ප්‍රධාන වශයෙන් අධ්‍යයන වැඩසටහන්, පටක රෝපණ කෙසෙල් නිෂ්පාදනය සහ ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් වල නිරත වේ. මීට අමතරව ග්‍රාමීය ගොවීන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ අවශ්‍යතා හඳුනාගෙන නව තාක්ෂණික ගොවිතැන් ක්‍රම සහ කෙසෙල් වගාවේ වැදගත්කම පිළිබඳවත් ඒ සඳහා ආයතනයේ ඇති මැදිහත්වීම පිළිබඳවත් වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

2015 වර්ෂය තුළ දී ආයතනයේ අධ්‍යයන අංශය හරහා අධ්‍යයන ක්‍රියාකාරකම් ද පැළ තවාන් හා විද්‍යාගාර භාවිතයෙන් පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය ද සිදුකරන ලදී. ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට සමගාමීව බොහෝ දක්ෂතා ඇති ගොවි සිසුන් සඳහා ඔවුන්ගේ කෘෂි ව්‍යාපාර හා ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා මූල්‍යාධාර සපයමින් එකී කෘෂි ව්‍යාපාර වල තත්ත්වය උසස් කිරීමට පියවර ගෙන ඇත.

ආයතන කාර්ය මණ්ඩල සාමාජිකයින් 58 දෙදෙනෙකුගේ සහයෝගයෙන් එහි අරමුණු කරා කටයුතු කළ අතර, පරිපාලන 5%, පරිපාලන/සහයක 11%, අධ්‍යයන 2%, අධ්‍යයන/සහයක 12%, අනධ්‍යන කාර්ය මණ්ඩලය 60% සහ දෛනික පදනමේ සේවකයින් 10% ක් ලෙස කාර්ය මණ්ඩලය සමන්විත වේ. (වගුව 02 සහ රූප සටහන-01). එම කාර්ය මණ්ඩලය අතර, සහකාර ලේඛකාධිකාරී, සහ සහකාර මුල්‍යාධිකාරී ස්ථිර සේවක මණ්ඩලය ලෙස 2012 වසර මැද දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පත්කරන ලද අතර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එක් අයකු හැර අනිකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් පැවරුම් පදනමක් මත (වාර්ෂිකව අලුත්කළ හැකි) සේවය කරයි. කොළඹ විශ්ව විද්‍යාලය විසින් 2013 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයතනයට ස්ථිර අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබූ අතර, ඒ වන තෙක් ලාල් සිල්වා මහතා (කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු වැඩබලන ලේඛකාධිකාරී) වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත.

| **කාර්යමණ්ඩල වර්ගීකරණය** | **සේවකයින් සංඛ්‍යාව** |
|---|---|
| පරිපාලන | 3 |
| පරිපාලන සහයක (පැවරුම් පදනම) | 6 |
| අධ්‍යයන | 1 |
| අධ්‍යයන සහයක (පැවරුම් පදනම) | 7 |
| අනධ්‍යන (පැවරුම් පදනම) | 35 |
| දෛනික පදනමේ සේවකයින් | 6 |
| **මුළු කාර්ය මණ්ඩලය** | **58** |

වගුව **02**




රූප සටහන-**01**

2015.12.31 දිනට ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලය වගුව - 03 තුළ දැක්වේ.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එම්.ඩී. පියතිලක මහතා | අධ්‍යක්ෂ |
| 2 | එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය | සහකාර ලේඛකාධිකාරී |
| 3 | ඒ.ඒ.එස්.සී. උබේසිංහ මහත්මිය | සහකාර මූල්‍යාධිකාරී |

වගුව – **03**

2015.12.31 දිනට ආයතනයේ පරිපාලන/සහයක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර වගුව - 04 තුළ දැක්වේ.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ඩබ්.කේ.කේ.රාජිකා නිලංගනී මහත්මිය | කළමනාකරණ සහකාර |
| 2 | ආර්.වී.පී.එන්.පී.කුමාර මහතා | කළමනාකරණ සහකාර |
| 3 | ඒ.ජී.යූ.වසන්ති මෙනවිය | කළමනාකරණ සහකාර |
| 4 | යූ.එම්.ඒ.ඒ.එම්.ද සිල්වා මෙනවිය | කළමනාකරණ සහකාර |
| 5 | ජේ.ඒ.යූ. ශ්‍රීනාත් මහතා | ගබඩා භාරකරු |
| 6 | ඩබ්.අයි.චතුමලී මෙනවිය | කළමනාකරණ සහකාර |

වගුව – **04**

2015.12.31 දිනට ආයතනයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (පොදු පරිපාලනය) වගුව - 05 තුළ දැක්වේ.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | කේ. එස්. ආර්. සම්පත් මහතා | ආරක්ෂක නිලධාරී |
| 2 | ඩබ්.එම්. චමින්ද මහතා | ආරක්ෂක නිලධාරී |
| 3 | කේ.පී. ගුණදාස මහතා | ආරක්ෂක නිලධාරී (අර්ධ කාලීන/ රාත්‍රී වැඩමුර) |
| 4 | ජේ.කේ. සුගතදාස මහතා | ආරක්ෂක නිලධාරී (අර්ධ කාලීන/ රාත්‍රී වැඩමුර) |
| 5 | එස්.වී. උපාලි මහතා | රියදුරු |

**වගුව – 05**

<u>**ඉඩම් අත්කරගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය**</u>

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ කමිටුව 2013.10.11 දින ආයතනය වෙත ඉඩම් අක්කර 50ක නීත්‍යානුකූල අයිතිය පැවරීමට එකඟ වී ඇති අතර ඉන් අක්කර 10 ක් මේ වන විටත් ආයතනය භාවිතා කරයි. කෙසේවෙතත්, අක්කර 40ක භූමි ප්‍රදේශය විල්මැන්න අභය භූමිය යටතට අයත්වන අතර, එය වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කෙරේ. මේ නිසා, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රදේශය තුළ සංවර්ධන කාර්යයන් හේතු කොට ගෙන සිදුවිය හැකි බලපෑම පිළිබඳව සොයා බැලීම සඳහා ඉඩම අත්කර ගැනීමට පෙර පාරිසරික බලපෑම ඇගයීම (EIA) ක් සිදු කිරීමට නිර්දේශ කරන ලදී.

ඒ අනුව, පාරිසරික බලපෑම ඇගයීම මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයේ පර්යේෂණ ඒකකයේ සහයෝගයෙන් පවත්වන ලද අතර, අවසාන වාර්තාව වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. වාර්තාව ඇගයීමෙන් පසු, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉඩම නිදහස් කිරීම සඳහා එහි අනුමැතිය ලබාදීමට සලකා බලයි. 2015 වසර තුළ, ඉඩම නිදහස් කිරීමේ ක්‍රියාවලියේ පදනම ආයතනය විසින් සාර්ථක අයුරින් සිදුකරන ලදී.

### 2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය

2008 වසරේ දී කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය මගින් ගොවි ප්‍රජාව වෙත අධ්‍යයන පාඨමාලා හඳුන්වා දුන් අතර එමගින් දැනට කෘෂි කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන් හට උසස් අධ්‍යාපනය ලබාදීමටත් ඔවුන් අතර මෙම අධ්‍යයන පාඨමාලා ප්‍රචලිත කිරීමට හා සංවර්ධනය කිරීමටත් අවස්ථාව ලැබී ඇත. එමගින්, පුද්ගල හා සමාජයීය අවශ්‍යතාවයක් වන අධ්‍යාපනය, "මිශ්‍ර ක්‍රමවේදයක්" හරහා කිසිවිටෙකත් උසස් අධ්‍යාපන මංපෙත් විවර නොවූ ගොවි ප්‍රජාව කරා රැගෙන යන්නේ ය. උසස් අධ්‍යාපනය ලබා ගැනීමට /හැදෑරීමට අවස්ථා සහ විභවයන් ඔවුන් සතු වුව ද ඔවුන්ගේ පෞද්ගලික හෝ පවුල් පසුබිම මත හෝ ආර්ථිකමය වශයෙන් පැන නැගුණ ගැටළු හේතුවෙන් එම අවස්ථා අහිමි වූ පිරිසක් මෙම අධ්‍යයන කටයුතුවල නිරත වේ. අධ්‍යයන පාඨමාලාවට ඇතුළත් වීම සඳහා වන ඇතුළත්වීමේ සුදුසුකම්වල සහ පාඨමාලා තෝරාගැනීමේදී දක්වන නම්‍යශීලීභාවය හදාරන්නන් හට ඉමහත් පහසුවක් වන අතර ආයතනය මගින් කරනු ලබන මගපෙන්වීම; නවීන තොරතුරු තාක්ෂණය හරහා ග්‍රාමීය ගොවි ප්‍රජාව හට ලබාදෙන මෙම උසස් අධ්‍යාපනයේ ඉහළ ගුණාත්මයට මෙන්ම අධ්‍යයන පාඨමාලා ඉතා පහසුවෙන් හැදෑරීමට හැකිවන පරිදි ඒවායෙහි ක්‍රමානුකූල බව පවත්වාගනිමින් ඊට අවකාශය සැළසීම ද ඔවුන්ගේ අධ්‍යයන, වෘත්තීමය සහ සමාජයීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට ඉමහත් රුකුලකි.

මෙය කෘෂි ව්‍යවසායකයින් හට ලැබුණු නවතම අධ්‍යාපන අවස්ථාවක් වන අතර තම මව් භාෂාව හරහා කෘෂි කාර්මික දැනුම වැඩි දියුණු කර ගැනීමට ශ්‍රී ලාංකික ග්‍රාමීය ගොවි ප්‍රජාව වෙත ලැබුණු ප්‍රථම අවස්ථාව මෙය වේ. ශ්‍රී ලාංකික ගොවි ප්‍රජාවගෙන් බහුතරය ග්‍රාමීයව වෙසෙන අතර ඔවුන්ගෙන් කෘෂිකර්මාන්තයට වන දායකත්වය ඉතා ඉහළය. අධ්‍යාපනය හැදෑරීමට සහ පුද්ගලික මෙන්ම වෘත්තීයමය දියුණුව ලඟාකර ගැනීම සඳහා ශ්‍රී ලාංකීක ග්‍රාමීය (ගොවි) ප්‍රජාව වෙත සැපයෙන පහසුකම් අවමය. එබැවින් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය මගින් ශ්‍රී ලාංකාව තුල ප්‍රථම වරට ලාංකික ගොවි ප්‍රජාව වෙත මෙවන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට අවකාශය සලසා දෙන ලදී. මෙම පාඨමාලාවේ සුවිශේෂී ලක්ෂණය වන්නේ මෙම පාඨමාලාව විවෘත සහ දුරස්ථ අධ්‍යාපන ක්‍රම වේදය ඔස්සේ සිදුකරගෙන යෑම වන අතර එය ශ්‍රී ලාංකික ගොවි ප්‍රජාවට නවතම අත්දැකීමක් වීමයි.

**අධ්‍යයන පාඨමාලාවේ අරමුණු**

❖ මිශ්‍ර ඉගැන්වීම් ක්‍රම වේදයක් ඔස්සේ (විශේෂිත වූ) ගොවි ප්‍රජාවට යාවජීව අධ්‍යාපන මූලධර්ම මත පිහිටමින් නම්‍යශීලීබව, ශිෂ්‍ය කේන්ද්‍ර ඉගෙනුම් ක්‍රමවේදය මඟින් ගොවි ප්‍රජාවට පුළුල් ප්‍රවේශයක් ලබාදෙමින් උසස් අධ්‍යාපනය (ප්‍රජාතාන්ත්‍රීකරණය කිරීම) සෑම පුරවැසියකුටම ලබාදීමේ අයිතිවාසිකම සනාථ කිරීමයි.

❖ ගොවි ප්‍රජාව/කෘෂි කර්මාන්තයේ නියැලෙන්නන් දැනුම මත පදනම් වූ කෘෂි කර්මාන්තයේ යෙදවීම තුළින් කෘෂි නිෂ්පාදනවල ගුණාත්මය සහ ප්‍රමාණාත්මය වැඩි කිරීම.

**වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණ**

- කිසිදිනෙක උසස් අධ්‍යාපන සිහිනය සැබෑ නොවූ ගොවි ජනතාව වෙත අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් සිදුවිම.
- කෘෂි කර්මාන්තයේ නියැලෙන අතරතුර උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව/වරම් ගොවි ප්‍රජාවට හිමි වීම.
- නව කෘෂි තාක්ෂණයන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලාංකීය ගොවි ප්‍රජාව වෙත හඳුන්වාදීම.
- ශ්‍රී ලාංකීක ගොවි ප්‍රජාව වෙනුවෙන් සැකසුණ ප්‍රථම විශ්ව විද්‍යාලයීය අධ්‍යයන පඨමාලාව වීම.
- වර්තමානය වන විට, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ආයතනය මඟින් ඩිප්ලෝමා , උසස් ඩිප්ලෝමා සහ උපාධි යන පාඨමාලා තුනක් හඳුන්වා දී තිබීම.

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ (BAgtec) අනුමැතිය ලබාදීම පිළිබඳ විස්තර**

සනාථන සභාවේ අනුමැතිය : 338 වැනි සනාථන සභා රැස්වීම (2010.09.29)-විෂය නිර්දේශය
පාලක සභාවේ අනුමැතිය : 462 වැනි පාලක සභා රැස්වීම (2012.08.15) - අතුරු ව්‍යවස්ථා
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය : 867 වැනි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම (2013.02.07) - උපාධි පාඨමාලාව

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ ආකෘතිය**

**<u>කෘෂි තාක්ෂණික උපාධිය (වසර 4කි)</u>**

**කෘෂි තාක්ෂණික ඩිප්ලෝමාව - (වසර 02 සහ මාස 03) සහතික පත් පාඨමාලා 09 කින්ද, (එක් පාඨමාලාවක් සඳහා කාලය මාස 03 කි.) සමන්විත වන අතර උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වසර 01 ද අනෙක් වසර උපාධි පාඨමාලාව සඳහා ද ඇතුළත් වේ.**

එක් එක් සහතිකපත් පාඨමාලාව සඳහා ගත වන කාලසීමාව මාස තුන කි. සහතික පත්‍ර පාඨමාලා 09 ම සමත් වන්නන් කෘෂි තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා සුදුසුකම් ලබයි. ඩිප්ලෝමා පාඨමාලාව, කෘෂි තාක්ෂණික උසස් ඩිප්ලෝමා පාඨමාලාව හරහා කෘෂි තාක්ෂණික උපාධිය දක්වා දීර්ඝ කිරීමේ දී එයට තවත් සහතික පත්‍ර පාඨමාලා 06, ගොවිපල පුහුණු පාඨමාලාවක් සහ මාස 06 පර්යේෂණ ව්‍යාපෘතියක් අයත් වේ. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මඟින් සම්මත කරන ලද එක් එක් පාඨමාලාව සඳහා නියමිත වූ සම්මාන (ක්‍රෙඩිට්) අගයක් සහිතය.

<u>පාඨමාලා පිරිනැමීමේ කාලසටහන</u>

<u>වසර 1</u>

* අඛණ්ඩ අධ්‍යාපනික පාඨමාලාව ලෙස ලබාදෙන ඉංග්‍රීසි පාඨමාලාව (0 සම්මාන)
* අඛණ්ඩ අධ්‍යාපනික පාඨමාලාව ලෙස ලබාදෙන තොරතුරු තාක්ෂණ පාඨමාලාව (0 සම්මාන)

**<u>විෂය පාඨමාලාවන්</u>**

| | **පාඨමාලාව** | **මොඩියුලය** | **සම්මාන වටිනාකම** | **පැසි** | **අධ්‍යයන කාලය (පැය)** |
|---|---|---|---|---|---|
| **1** | හෝග වගාව<br>**CH**<br>**මොඩියුල 03**<br>**මාස 03** | **CH01.** හෝග විද්‍යාව සහ ශෂ්‍ය විද්‍යාව<br>**CH02.** පාංශු විද්‍යාව<br>**CH03.** ආර්ථිකමය වශයෙන් වැදගත් හෝග වගාව | 08 | අධ්‍යයන පැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු / සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>60<br><br>90<br>24<br>6<br>***300*** |
| **2** | උද්‍යාන හෝග වගාව<br>**මොඩියුල03**<br>**මාස 03** | **HO 01.** පැළ තවාන් කළමනාකරණය හා ගෙවතු වගාව<br>**HO 02.** එළවලු සහ පළතුරු වගාව<br>**HO 03.** නවීන කෘෂි තාක්ෂණික භාවිතයන් | 08 | අධ්‍යයන පැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු / සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>50<br><br>100<br>24<br>6<br>***300*** |
| **3** | හෝග ආරක්ෂණය<br>**මොඩියුල 03**<br>**මාස 03** | **CP 01.** පළිබෝධ සහ රෝග කළමනාකරණ මූලධර්ම<br>**CP 02.** ආර්ථික වශයෙන් වැදගත් වන හෝගවල පළිබෝධ පාලනය<br>**CP 03. .** ආර්ථික වශයෙන් වැදගත් වන හෝගවල රෝග පාලනය | 08 | අධ්‍යයන පැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු / සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>75<br><br>75<br>24<br>6<br>***300*** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **4** | වගා ජල පාලනය<br><br>**මොඩියුල 03**<br>**මාස 03** | **IR 01.**වගා ජල පාලන ජල සම්පාදනය සහ ජල වහනය හැඳින් වීම<br>**IR 02.** භෝග ජල කළමනාකරණය<br>**IR 03. ක්ෂුද්‍ර ජල සම්පාදනය සහ පොහොර ජල සම්පාදනය** | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු / සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>මුළු ගණන | 120<br>50<br><br>100<br>24<br>6<br>***300*** |

වගුව **06**

<u>වසර **2**</u>

* ඉංග්‍රීසි අඛණ්ඩ අධ්‍යාපනික පාඨමාලාව (0 සම්මාන)
* තොරතුරු තාක්ෂණ අඛණ්ඩ අධ්‍යාපනික පාඨමාලාව (0 සම්මාන)

<u>**විෂය පාඨමාලා**</u>

| | **පාඨමාලාව** | **මොඩියුලය** | **සම්මාන වටිනාකම** | **සැසි** | **අධ්‍යයන කාලය** |
|---|---|---|---|---|---|
| 5 | ආහාර තාක්ෂණය<br>**මොඩියුල03**<br>**මාස 03** | **FT 01.** ආහාර තාක්ෂණය හඳුන්වාදීම<br>**FT 02.** ආහාර සංරක්ෂණය, ඇසුරුම් කිරීම සහ ආහාර නිෂ්පාදනය සඳහා අගය එකතු කිරීම<br>**FT03.** ආර්ථික වශයෙන් වැදගත් වන ආහාර නිෂ්පාදන නිෂ්පාදනය | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>75<br><br>75<br>24<br>6<br>***300*** |
| 6 | පසු-අස්වනු තාක්ෂණය<br>**මොඩියුල03**<br>**මාස 03** | **PHT 01.** පසු -අස්වනු තාක්ෂණය හඳුන්වාදීම<br>**PHT 02.** ධාන්‍ය, පළතුරු හා එළවළුවල පශ්චාත් -අස්වනු මෙහෙයවීම<br>**PHT 03.** පසු -අස්වනු රෝග | 08 | අධයයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>60<br><br>90<br>24<br>6<br>***300*** |
| **7** | මල් වගාව<br><br>**මොඩියුල 02**<br>**මාස 03** | **FL 01.** මල් වගාව හඳුන්වාදීම<br>**FL 02.** කැපුම් මල් සහ පත්‍රික ශාක | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>50<br><br>100<br>24<br>6<br>***300*** |
| **8** | කෘෂි - ව්‍යාපාර කළමනාකරණය<br><br>**මොඩියුල03**<br>**මාස 03** | **ABM 01**. කෘෂි- ව්‍යාපාර කළමනාකරණය<br>**ABM 02.** අලෙවිකරණය<br>**ABM 03.** කෘෂි ව්‍යවසායකත්වය | 08 | අධ්‍යයන සැසි<br>කුඩා ව්‍යාපෘති<br>සිද්ධි අධ්‍යයන<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 100<br>100<br>50<br>24<br>6<br>***300*** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **9** | සත්ත්ව නිෂ්පාදනයේ මූලධර්ම<br><br>**මොඩියුල03**<br>**මාස 03** | **FAH 01:** සත්ත්ව නිෂ්පාදනය හැඳින්වීම<br>**FAH 02:** ව්‍යුහ විද්‍යාව හා කායික විද්‍යාව<br>**FAH 03:** සත්ව පාලනය සහ සත්ත්ව නිෂ්පාදනය පිළිබඳ මූලධර්ම | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>90<br><br>50<br>30<br>10<br>**300** |

වගුව **07**

ඉහත සහතිකපත්‍ර පාඨමාලා 9 අවසන් කිරීමෙන් පසු, කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව පිරිනමනු ලැබේ. සියලුම පාඨමාලා (9) සඳහා අවම වශයෙන් සම්මාන සහ අවමය 2.75 GPA අගයක් සහිතව කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සම්පූර්ණ කරන සිසුන්ට උසස් කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව කරගෙන යා හැකි අතර ඊට පසුව කෘෂි තාක්ෂණය පිළිබඳ උපාධිය ලබාගත හැක.

කෘෂි තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් පාඨමාලා සම්පූර්ණ කළ යුතුය.

| | **පාඨමාලාව** | **මොඩියුලය** | **සම්මාන වටිනාකම** | **සැසි** | **අධ්‍යයන කාලය (පැය)** |
|---|---|---|---|---|---|
| 9 | කාබනික ගොවිතැන සහ බීජ නිෂ්පාදනය<br>**මොඩියුල03**<br>**මාස 03** | **OF 01.** කාබනික ගොවිතැන<br>**OF 02.** කාබනික බීජ නිෂ්පාදනය සහ පාරිසරික ගොවිතැන<br>**OF 03.** මීමැසි පාලනය | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>50<br><br>100<br>24<br>6<br>***300*** |
| 10 | ගොවිපල යාන්ත්‍රීකරණය<br>**මොඩියුල03**<br>**මාස 03** | **FM 01.** ගොවිපල යන්ත්‍රෝපකරණ හැඳින් වීම<br>**FM 02.** ගොවිපල යන්ත්‍රෝපකරණ උපාංග හා ගොවිපල යන්ත්‍රෝපකරණ නඩත්තුව<br>**FM 03.** ජල සම්පාදන පද්ධතිය සැළසුම් කිරීම | 08 | අධ්‍යයන සැසි<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 90<br>180<br>24<br>6<br>***300*** |
| **11** | ජලජ වගාව සහ ධීවර/ ව්‍යවසායකත්ව කළමනාකරණය<br>**මොඩියුල03**<br>**මාස 03** | **AF 01.** ජලජීවී වගාව<br>**AF 02.** මත්ස්‍ය කර්මාන්තය<br>**AF 03.** විසිතුරු මසුන් වගාව | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>75<br><br>75<br>24<br>6<br>***300*** |
| **12** | ක්ෂීර සහ සත්ත්ව විද්‍යාව<br>**මොඩියුල 03**<br>**මාස 03** | **DA 01.** රෝමාන්තික ගොවිපොළ සතුන් පාලනය<br>**DA 02.** ක්ෂීර සහ තෘණ විද්‍යාව<br>**DA 03.** කුකුළු සහ ඌරු පාලනය | | අධ්‍යයන සැසි<br>කුඩා ව්‍යාපෘති<br>සිද්ධි අධ්‍යයන<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>75<br>75<br>24<br>6<br>***300*** |

වගුව **08**

ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගැනීමෙන් පසු කෘෂි තාක්ෂණය පිළිබඳ උපාධිය සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් පාඨමාලාව හැදෑරිය යුතුය.

| | පාඨමාලාව | මොඩියුලය | සම්මාන වර්ගීකරණ ම | සැසි | අධ්‍යයන කාලය (පැය) |
|---|---|---|---|---|---|
| 13 | ජාන විද්‍යාව, අභිජනනය සහ ජෛව තාක්ෂණය<br>**මොඩියුල 03**<br>**මාස 03** | **BT 01.** ප්‍රවේණි විද්‍යාව<br>**BT 02.** අභිජනනය<br>**BT 03.** ජෛව තාක්ෂණය | 08 | අධ්‍යයන සැසි<br>විද්‍යාගාර ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 120<br>75<br>75<br>24<br>6<br>***300*** |
| 14 | ජෛව සංඛ්‍යානය<br>**මොඩියුල 03**<br>**මාස 03** | **BS 01.** ජීව සංඛ්‍යානය හැඳින් වීම<br>**BS 02.** පර්යේෂණ සැළසුම්කරණය<br>**BS 03.** ව්‍යාපෘති වාර්තා සැකසීම සහ සම්මන්ත්‍රණ | | අධ්‍යයන සැසි<br>පරිගණක ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br>දින වැඩමුළු /සම්මන්ත්‍රණ<br>පැවරුම්<br>**මුළු ගණන** | 200<br>60<br>30<br>10<br>***300*** |
| **15** | ගොවිපල ප්‍රායෝගික පාඨමාලාව<br>**මාස 04** | | | | |
| **16** | පර්යේෂණ ව්‍යාපෘතිය**<br>**මාස 06** | | | | |

** (4 වැනි අධ්‍යයන වසරේදී ආරම්භ කළ හැක) **වගුව 09**

ප්‍රායෝගික, පැවරුම්, සිද්ධාන්ත මෙන්ම ආධුනිකව අධ්‍යයනය ලබන්නන් හට දෙනු ලබන සහය සේවාවන් වැනි මෙම වැඩසටහනේ සියලුම සංරචක ග්‍රාමීය ගොවි ප්‍රජාව; කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි ඉහළින් දායක වී ඇත.

තවද, මෙම ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා තරුණ පරම්පරාවට සමාජයෙහි පිළිගැනීමක් සහිතව කෘෂිකර්මාන්තය තුළ රැඳී සිටීම අභිප්‍රේරණය කරමින් ඒ සඳහා අවස්ථාව සළසා දේ.

**අධ්‍යාපනික වැඩසටහන් සඳහා ඇතුළත්වීමේ සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කෙරෙන පුවත්පත් දැන්වීමක් තුළින් උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් අයදුම්පත් කැඳවීම මගින් ඇතුළත්වීම සිදු කෙරේ.

- අවම වසයෙන් වසර 05ක කාල සීමාවක් තුළ කෘෂිකර්ම/ කෘෂි-ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නියැලී සිටින සහ අ.පො. ස. (උසස් පෙළ) විභාගය සාර්ථකව සමත් වී ඇති පුද්ගලයින් බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබයි ;

  **හෝ**

- අවම වෂයෙන් වසර 07ක කාලසීමාවක් තුල කෘෂිකර්ම/ කෘෂි-ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ නියැලී සිටින සහ අ.පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සාර්ථකව සමත් වී ඇති පුද්ගලයින් බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගැනීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

අභියෝගයතා පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ලියාපදිංචිය සිදු කෙරේ.

2008 වසරේදී කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හඳුන්වාදීමෙන් පසු, වාර්ෂිකව බඳවා ගනු ලබන සිසුන් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි කිරීමට ආයතනයට හැකි විය.

2015 වසරේදී සිසුන්ගේ මුළු සංඛ්‍යාව පහත දක්වා ඇත (වගුව - 10).

| කණ්ඩායම | ගැහැණු | පිරිමි | මුළු ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| 1 කණ්ඩායම | 04 | 13 | 17 | උපාධිය හැදෑරීම - පර්යේෂණ ව්‍යාපෘතිය |
| 2 කණ්ඩායම | 01 | 17 | 18 | 30 දෙනෙක් ඩිප්ලෝමාව සම්පූර්ණ කළ අතර උපාධිය සඳහා 20 දෙනෙක් තෝරා ගනු ලැබීය |
| 3 කණ්ඩායම | 04 | 13 | 17 | 24 දෙනෙක් ඩිප්ලෝමාව සම්පූර්ණ කළ අතර උසස් ඩිප්ලෝමාව හදාරමින් සිටී |
| 4 කණ්ඩායම | 08 | 30 | 38 | ඩිප්ලෝමාව හැදෑරීම |
| 5 කණ්ඩායම | 06 | 40 | 46 | ඩිප්ලෝමාව හැදෑරීම |
| 6 කණ්ඩායම | 30 | 56 | 86 | ඩිප්ලෝමා මට්ටම |

වගුව – **10**

- කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කරන ලද 2 වැනි සහ 3 වැනි කණ්ඩායම් සඳහා ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය හම්බන්තොට, මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේදී (MRICC) 2015 ජූනි මස 03 දින පවත්වන ලදී. ඒ අනුව, ඩිප්ලෝමාධාරීන් 53 දෙදෙනෙකුට එම උත්සවයේදී ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදී.
- 2015.08.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස එන්.පී. විදානපතිරණ මහත්මිය/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පත්කරමින් කෘෂි තාක්ෂණික දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

2015.12.31 දිනට අධ්‍යයන වැඩසටහනේ කාර්ය මණ්ඩලය පහතින් දැක්වේ.

**අධ්‍යයන (ස්ථිර)**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එන්.පී. විදානපතිරණ මහත්මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය II |

වගුව **11**

**අධ්‍යයන (තාවකාලික)**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 2 | එස්.ඒ.පී. නෙල්කා මහත්මිය | පාඨමාලා සම්බන්ධීකාරක |
| 3 | එස්.එල්. නවරත්න මහත්මිය | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 4 | එච්.ආර් චාමර මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |

| | | |
|---|---|---|
| 5 | එච්.කේ.ආර්.එස් කුමාර මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 6 | ජේ.එල්.එච්. නිශාන්ත මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 7 | ටී.ජී.බී. ධනුෂ්ක මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |
| 8 | බී.පී. සිරිවර්ධන මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක |

**වගුව - 12**

අනධ්‍යයන

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | පී.බී. දර්ශන මහතා | පරිගණක යෙදුම් සහකාර |

**වගුව – 13**

- විෂය ප්‍රවීන දැනුම ලබාගැනීම සඳහා සහ එක් එක් පාඨමාලාවේ ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා අධ්‍යයන පාඨමාලාවල එක් එක් සහතිකපත්‍ර පාඨමාලා සඳහා UCIARS කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය සහිතව කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාව විසින් විෂය ප්‍රවීනයින් පත්කරනු ලැබේ.

## 2.2 ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහනේ කාර්යසාධනය

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය වෙතින් ගොවි සිසුන් හට නව කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීම හෝ දැනට පවතින කෘෂි ව්‍යාපාර වැඩිදියුණු කිරීම, එම සිසුන්ගේ ආර්ථික මට්ටම සහ ජීවනෝපාය ක්‍රම ශක්තිමත් කිරීමේ අරමුණින්, අවශ්‍ය වන මූලික මූල්‍යාධාර සැපයීම සඳහා 2011 වර්ෂයේ "ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටන"(RED) ආරම්භ කරන ලදී. මෙම ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටන නිර්මාණය කර තාක්ෂණික උපදෙස් ලබාදෙමින් ක්‍රියාවට නැංවීම සිදුකරන ලද්දේ කොරියානු කෘෂිකාර්මික ව්‍යාපාර සංකල්පයේ නිර්මාතෘ සම්මානනීය මහාචාර්ය කිම් ජෝ හෝ විසිනි-(KOICA) මහාචාර්ය කිම් කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය වෙත පත්කරන ලද ගරු උපදේශකවරයෙකි. (World's friend advisor)

### 2012 – 2013 කාර්යසාධනය

RED වැඩසටහනට ආරම්භයක් ලෙස, ආයතනය තෝරාගත් දක්ෂ ගොවි සිසුන් වෙත නව කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීම හෝ දැනට පවත්නා කෘෂි ව්‍යාපාර නගා සිටුවීම සඳහා මූල්‍ය සහයෝගය ලබා දෙන ලදී. 2012 ජනවාරි, සෑම සිසුවෙක් සහ ආයතනය අතර අත්සන් කරනු ලබන ගිවිසුම් යටතේ ඉතා නම්‍යශීලී කොන්දේසි අනුව රු. 100,000.00 දක්වා තෝරාගත් ප්‍රතිලාභීන් වෙත මූල්‍යාධාර පිරිනමන ලදී. RED වැඩසටහනේ ප්‍රගතිය ඉන් අපේක්ෂිත ප්‍රතිඵල අනුව 2013 දෙසැම්බර් අවසානයේ සැලකියයුතු මට්ටමක පැවතිණ. 2013 දෙසැම්බර් අවසානය වන විට අමතර අගය නිර්මාණය තුළ අත්කරගැනීම් ආසන්න වශයෙන් මිලියන 3ක් වූ අතර, මෙම කාලසීමාව තුළ නව රැකියා අවස්ථා 12ක් ව්‍යවසායකයින් 12 දෙනෙකු විසින් උත්පාදනය කොට ඇත.

### 2014 කාර්යසාධනය

ගොවි භාරකාර අරමුදල 2014 වසරේදී ආයතනය වෙත 1%ක පොළියට රුපියල් මිලියන දෙකක් ලබාදීමට එකඟ වූ අතර එම මුදල් සිසුන් අතර බෙදා දී ඇත. මෙම ගිවිසුම අනුව, ඔවුන් ආයතනය වෙත රු.1,000,000.00 ක් ලබා දේ. ව්‍යවසායකයින් හත් දෙනෙක් ඔවුන්ගේම කෘෂි ව්‍යාපාර ආරම්භ

කිරීමට හෝ තම ව්‍යාපාර වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය සහය ලබාදීම සඳහා තෝරාගනු ලැබූ අතර 2014 මාර්තු 07 දින ඔවුන් අතර අරමුදල් බෙදා දෙන ලදී.

මෙම වැඩසටහනේ දෙවන අදියර ලෙස, ගොවි භාරකාර අරමුදල තවත් රු.1,000,000.00 ක් නිදහස් කරනු ලැබූ අතර, මෙම මුදල තමන්ගේම කෘෂි ව්‍යාපාර වර්ධනය කර ගැනීම සඳහා තෝරාගත් කෘෂි ව්‍යවසායකයින් 10 දෙනෙකු අතර 2014 නොවැම්බර් මස බෙදා දෙන ලදී.

තවද, ආයතනය විසින් 2014 දෙසැම්බර් මස HETC ව්‍යාපෘතිය යටතේ ගොවි සිසුන් තිදෙනෙක් අතර රෝපණ ද්‍රව්‍ය බෙදා දුන්හ. මේ යටතේ, ආයතනය ගොවි සිසුන් වෙත රු.256,600.00 ක් වටිනා “ජ'බරා” පැළ සහ “TJC” අඹ පැළ ලබාදෙන ලදී.

**2015 කාර්යසාධනය**

ගොවි භාරකාර අරමුදල 2015 වසර වෙනුවෙන් රු. 1,400,000.00ක් ලබාදෙන ලදී. ගොවි සිසුන් දහසය දෙනෙක් මෙම වැඩසටහනට එකතුවීම සඳහා අයදුම් කර ඇත. එසේවුවත්, තමන්ගේම කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ තම ව්‍යාපාරය වැඩි දියුණු කිරීම සඳහා ගොවි සිසුන් 07 දෙනෙක් අතර රු.1,400,000.00 මුදලක් බෙදා දීමට ආයතනයට හැකි විය.

මෙම වැඩසටහන යටතේ, 2015 ජූලි මස ගොවි සිසුන් දෙදෙනෙක් වෙත රු.135,960.00 ක් වටිනා කෙසෙල් පැළ බෙදාහරින ලද අතර රු.375,250.00ක් වටිනා “රෝස” සහ “ජ'බරා” රෝපණ ද්‍රව්‍ය HETC ව්‍යාපෘති අරමුදල් යටතේ පොළී රහිත ණයක් ලෙස ගොවි සිසුන් 3 දෙනෙක් අතර බෙදා දෙන ලදී.

ණය ආපසු අයකරගැනීම ආරම්භ කිරීමට පෙර, ගොවීන් වෙත මාස 06 ක සහන කාලසීමාවක් ලබා දේ (ගොවි භාරකාර අරමුදල (FTF) ණය සහ රෝපණ ද්‍රව්‍ය ණය යන වර්ග දෙක සඳහා). 2015 වසර තුළ එක් එක් ණය අයකර ගැනීමේ ප්‍රතිශතය පහතින් දැක්වේ.

| ණය | ණය ලබාදුන් ගොවි සංඛ්‍යාව | මුළු ණය මුදල (රු.) | **2015.12.31** දිනට අය කරගත් ප්‍රතිශතය |
|---|---|---|---|
| පළමු ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) ණය | 12 | 1,200,000.00 | 74% |
| FTF ණය – පළමු පියවර | 07 | 1,000,000.00 | 53% |
| FTF ණය –දෙවන පියවර | 10 | 1,000,000.00 | 17% |
| FTF ණය –තෙවන පියවර | 07 | 1,400,000.00 | සහන කාලසීමාව |
| රෝපණ ද්‍රව්‍ය ණය-2014 | 03 | 256,600.00 | 22% |
| රෝපණ ද්‍රව්‍ය ණය-2015 | 05 | 511,210.00 | 3% |

වගුව **14**

ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහන යටතේ, ආයතනය විසින් බිම්මල් වගාව, අඹ වගාව, ඵලදායිතා සංවර්ධනය, පළිබෝධක කොම්පෝස්ට් කිරීම සහ TJC අඹ පිළිබඳව දැනුවත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

1. ආයතනය සමඟ එකතු වූ කෘෂි ව්‍යවසායකයින් සඳහා කෘෂි ඵලදායිතා පුහුණු වැඩසටහන (කෙසෙල්, බිම්මල් සහ අඹ වගාව තුළ යෙදී සිටින ගොවීන්) වැලිගත්ත කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේදී (UCIARS) 2015.02.20 සහ 2015.02.22 පවත්වන ලද අතර සම්පත් දායකත්වය ජාතික ඵලදායිතා මහලේකම් කාර්යාලය විසිනි.

2. කෘෂි ව්‍යවසායකයින් සහ ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා කෘෂි ඵලදායිතා සංවර්ධන සහතිකපත් පාඨමාලාව වැලිගත්ත කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේදී (UCIARS) 2015.02.28, 2015.03.01, 2015.03.20, 2015.03.21 සහ 2015.03.22 පවත්වන ලද අතර සම්පත් දායකත්වය ජාතික ඵලදායිතා මහලේකම් කාර්යාලය විසිනි.

3. වීරවිල, ලුණුගම්වෙහෙර සහ තිස්සමහාරාමයේ TJC අඹ ගොවීන් සඳහා ලුණුගම්වෙහෙර නේවාසික ව්‍යාපෘති කළමනාකාර කාර්යාලයේදී TJC අඹ පුහුණු වැඩසටහන 2015.07.14 දින පවත්වන ලද අතර සම්පත් දායකත්වය එල්ලාවල හෝර්ටිකල්චර් පුද්ගලික සමාගමේ කළමනාකරු සහ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) කාර්ය මණ්ඩලය විසිනි.

4. බඹරවාන කනිටු විද්‍යාලේ සිසුන් වෙත පලිබෝධක කොම්පෝස්ට් නිෂ්පාදනය හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන වැලිගත්ත කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේදී 2015.07.21 දින පවත්වන ලදී.

5. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) ගොවි සිසුන් සඳහා විද්‍යුත්- අලෙවිකරණ ව්‍යාපාර පුහුණු වැඩසටහන 2015.07.31 දින පවත්වන ලදී.

6. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) ගොවි සිසුන් සඳහා බිම්මල් පුහුණු වැඩසටහන 2015.09.23 දින පවත්වන ලදී.

TJC අඹ වගා ව්‍යාපෘතිය 2015 වසර තුළ පවත්වාගෙන ගිය අතර, කිරිදිඹය ව්‍යාපෘතියෙහි ව්‍යාපාරික මට්ටමින් TJC අඹ වගාව සිදුකරන ගොවීන්ගේ ආදායම් මට්ටම වැඩි කිරීම පිණිස, කෘෂි-තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වාරිමාර්ග සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සහ එල්ලාවල හෝර්ටිකල්චර් පුද්ගලික සමාගමේ සහයෝගීත්වයෙන් TJC අඹ වගා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. පුහුණු වැඩසටහන් සංවිධානය කරමින් සහ කාලීනව ක්ෂේත්‍ර චාරිකා සිදුකරමින් ආයතනය ගොවීන් වෙත තාක්ෂණික දැනුම ලබා දේ.

2015.12.31 දිනට ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහනේ කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ජේ.එල්.එච්. නිශාන්ත මහතා | සහකාර පාඨමාලා සම්බන්ධීකාරක/අධ්‍යයන සහ සම්බන්ධීකාරක /RED වැඩසටහන |
| 2 | ඉරෝෂා චතුමලී මෙනවිය | කළමනාකරණ සහකාර/ RED වැඩසටහන |

වගුව – **15**

## 2.3 පැළ තවාන/ විද්‍යාගාර කාර්යසාධනය

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව 2008 වර්ෂයේ දී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ආරම්භ කළ ද, කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතියක් ලෙස 1998 දී දුප්පත් ග්‍රාමීය ගොවි ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා පටක රෝපණ ඒකකය ආරම්භ කරන ලදී. 2001 වර්ෂයේ දී විද්‍යා පීඨයේ පැළෑටි විද්‍යා අංශය (Department of Plant Science) මගින් ආදර්ශනයක් ලෙස මෙම ආයතනය සඳහා පටක රෝපණ කෙසෙල් හා කිරි අල පටක රෝපණය කිරීම හඳුන්වා දෙන ලදී. 2003 සිට මෙම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයේ මහ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ආයතනයේම නිෂ්පාදනයක් ලෙස කර ගෙනයාමට සමත් විය. අලුතින් පත්කරන ලද විද්‍යාගාර කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා අඛණ්ඩ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩමුළු කොළඹ විශ්ව විද්‍යාලය මගින් සිදුකරන ලදී.

**2015.12.31 දිනට පැළ තවාන/ විද්‍යාගාර කාර්ය මණ්ඩලය පහත දැක්වේ.**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එස්.වී.ජී.එන්. ප්‍රියදර්ශනී මෙනෙවිය | පර්යේෂණ සහකාර (ප්‍රධානී /විද්‍යාගාර) |
| 2 | එච්. රෝහනධීර මහතා | පර්යේෂණ සහකාර (ප්‍රධානී/ පැල තවාන්) |
| 3 | ටී.ඒ.කේ.වයි. ඉදුනිල් මහතා | ක්ෂේත්‍ර ප්‍රධානී |
| 4 | එච්.කේ.එස්. ඉෂාරා මහතා | ක්ෂේත්‍ර සහකාර |
| 5 | පී.ඩබ්.ඒ. චමින්ද ජයලත් මහතා | තාක්ෂණික සහකාර |
| 6 | බී.ජී.සුසිර කුමාර මහතා | තාක්ෂණික සහකාර |
| 7 | ඒ.එන්. අබේගුණවර්ධන මහතා | පටක රෝපන සහකාර |
| 8 | එච්.කේ. සමන්ති නිලිනි කුමාරි මහත්මිය | පටක රෝපන සහකාර |
| 9 | එම්.ජී.සී. සුදර්ශනී මහත්මිය | පටක රෝපන සහකාර |
| 10 | ඒ. ප්‍රියංගා සුදර්ශි මහත්මිය | පටක රෝපන සහකාර |
| 11 | යූ. අනූෂා රුවනි මෙනවිය | පටක රෝපන සහකාර |
| 12 | ඩබ්.එච්. දිස්නා සඳමාලි  මහත්මිය | පටක රෝපන සහකාර |
| 13 | අයි.ජී. දිලිනි නිරෝෂා කුමාරි මෙනවිය | පටක රෝපන සහකාර |
| 14 | ඕ.පී.. නිලූකා සුභාෂිණි මෙනවිය | පටක රෝපන සහකාර |
| 15 | ඩී. ඉෂාදි නිමල්ගා මහත්මිය | පටක රෝපන සහකාර |
| 16 | කේ.පී. උදේනි නිසංසලා මහත්මිය | පටක රෝපන සහකාර |
| 17 | පී.එස්. සරසිකා අබේවික්‍රම මහත්මිය | පටක රෝපන සහකාර |
| 18 | ඩබ්.එච්. නෙළුම් සුරංගි වාසනා මහත්මිය | පටක රෝපන සහකාර |
| 19 | ඩබ්.එච්. විචිත්‍රා කල්පනී මෙනවිය | පටක රෝපන සහකාර |
| 20 | ඉසන්කා චමෙදනී දොඩම්පේ  මෙනවිය | පටක රෝපන සහකාර |
| 21 | එන්.එස්. පෙරේරා මහත්මිය | පටක රෝපන සහකාර |
| 22 | එච්.ආර්. අකීෂා මධුමාලි මහත්මිය | පටක රෝපන සහකාර |
| 23 | ඩබ්.එස්. මධුෂානී මහත්මිය | පටක රෝපන සහකාර |
| 24 | ආර්.එච්.බී. හාෂිණි මහත්මිය | පටක රෝපන සහකාර |
| 25 | ඩබ්.කේ.එම්. ශෂිකලා මහත්මිය | පටක රෝපන සහකාර |
| 26 | කේ.ජී. දිල්රුක්ෂි මහත්මිය | පටක රෝපන සහකාර |
| 27 | ජී.ඒ. විමුක්ති ශාලිකා මහත්මිය | පටක රෝපන සහකාර |

| | | |
|---|---|---|
| 28 | ඩබ්.එච්. යූ. කෞෂල්‍යා මෙනවිය | පටක රෝපන සහකාර |
| 29 | කේ.ජී.ඩී. ප්‍රසාදි මහත්මිය | පටක රෝපන සහකාර |
| 30 | එන්.එස්. ප්‍රදීප් මහතා | ක්ෂේත්‍ර සහකාර |

වගුව **16**


**2015 වසරේ කාර්යසාධනය**

**විද්‍යාගාර තුනේ පැළ නිෂ්පාදන වාර්තා (සංඛ්‍යාව)**

| | විද්‍යාගාරය **01** | විද්‍යාගාරය **02** | විද්‍යාගාරය **03** | මුළු ගණන **2015** |
|---|---|---|---|---|
| ජනවාරි | 10283 | 6020 | 4012 | 20315 |
| පෙබරවාරි | 7873 | 8157 | 4097 | 20127 |
| මාර්තු | 8181 | 8229 | 4201 | 20611 |
| අප්‍රේල් | 6058 | 4020 | 2502 | 12580 |
| මැයි | 5410 | 5478 | 3964 | 14852 |
| ජූනි | 5991 | 6722 | 1505 | 14218 |
| ජූලි | 6033 | 3989 | 2007 | 12029 |
| අගෝස්තු | 8039 | 2007 | 3975 | 14021 |
| සැප්තැම්බර් | 8068 | 7961 | 2001 | 18030 |
| ඔක්තෝබර් | 9430 | 8995 | 4002 | 22427 |
| නොවැම්බර් | 9558 | 7993 | 4006 | 21557 |
| දෙසැම්බර් | 9499 | 7846 | 3994 | 21339 |
| මුළු ගණන | **94423** | **77417** | **40266** | **212106** |

වගුව **17**


**විද්‍යාගාර තුනේ පැළ නිෂ්පාදනය සංසන්දනය කිරීම**




රූප සටහන **02**

විද්‍යාගාරය 01 සහ 02 එක් මාසයකට පැළ 8000 ක් නිෂ්පාදනය කිරීම සඳහා කටයුතු කරගෙන ගිය අතර, විද්‍යාගාරය 3 එක් මාසයකට පැල 4000 ක් නිෂ්පාදනය කිරීමට අරමුණු කරමින් සිටී. විද්‍යාගාරය 01 ඉලක්කයෙන් 98.36% ක ප්‍රතිශතයක් අත්කරගෙන ඇති අතර, විද්‍යාගාරය 02 ඔවුන්ගේ ඉලක්කවලින් 80.64% ක් අත්කරගෙන ඇත. විද්‍යාගාරය 03 ඔවුන්ගේ ඉලක්කවලින් 83.89% ක් අත්කරගෙන ඇති අතර විද්‍යාගාර තුන පිළිබඳව සලකා බැලීමේදී, ඒවායේ 2015 ඉලක්කවලින් 88.38% ක් අත්කරගෙන ඇත. .

**පසුගිය වසර පහ තුළ පැළ නිෂ්පාදනය සැසඳීම**




**රූප සටහන 03**

පසුගිය වසර හතර තුළ රැස්කළ දත්තවලට අනුව, ජනවාරි සිට අප්‍රේල් දක්වා සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මාස තුළදී ඉහළ ඉල්ලුමක් ඇති ආකාරයක් දක්නට ඇත. එමනිසා, ඉහළ ඉල්ලුමක් ඇති කාලසීමාවන්වලදී තවාන් වෙත පැල නිකුත් කිරීම් උපරිම කිරීම සඳහා නිෂ්පාදන සැලසුම් වෙනස් කරන ලදී. විද්‍යාගාරයෙන් පැල නිකුත් කිරීම් වසර පුරා පැල අලෙවියට අනුව වෙනස්වන අතර, වර්ෂාව, නියඟය, කෙසෙල් ගෙඩිවල වෙළෙඳ පොල මිල වැනි පාරිසරික සාධක සහ ප්‍රජාවගේ ආකල්ප වැනි වෙනත් සාධක මත මෙය රඳා පවතී.


**2015 වසර තුළ කෙසෙල් නිෂ්පාදනය සැසැඳීම**

මුළු නිෂ්පාදනයෙන්, 100% ක් සඳහා ඇඹුල් කෙසෙල් දායක වූ අතර කෝලිකුට්ටු කෙසෙල් පැල 356 ක් පමණක් 2015 වසර තුළ නිෂ්පාදනය කරන ලදී.


පසුගිය වසර කිහිපයට සාපේක්ෂව 2015 වසර තුළ පැල නිෂ්පාදනය වැඩිවී ඇති බවට පැහැදිළි සාක්ෂි ඇත. එමෙන්ම, පටක රෝපන කෙසෙල් මිලදී ගැනීම සඳහා ගොවීන්ට ගතවන කාලය අඩු කිරීම උදෙසා නව ක්‍රමවේදයක් (වාර නිෂ්පාදනය වැඩිකිරීම) හඳුන්වාදෙන ලදී.

**පැළ අලෙවිය සැසඳීම**


| | 086-6001-00006475-6 | 2015/12/22 | 2016/12/22 | මාස 12 | 6.50% | 2,826,282 | | 8 | 183,708 | 4,530 | 179,179 | 4,783 | - | 3,009,990 |
| | 086-6001-00006476-5 | 2015/12/22 | 2016/12/22 | මාස 12 | 6.50% | 2,826,282 | | 8 | 183,708 | 4,530 | 179,178 | 4,783 | - | 3,009,990 |
| | 086-6001-00006477-4 | 2015/12/22 | 2016/12/22 | මාස 12 | 6.50% | 4,239,423 | | 8 | 275,562 | 6,795 | 268,767 | 7,174 | - | 4,514,985 |
| | 086-6001-00006484-5 | 2015/12/27 | 2016/12/27 | මාස 12 | 6.50% | 1,600,563 | | 3 | 104,037 | 1,140 | 102,897 | 1,016 | - | 1,704,600 |
| | | | | | | **15,661,407** | | | **1,031,417** | **60,699** | **970,718** | **58,779,12** | **-** | **16,692,825** |

## 2015.12.31 දිනට කෙටි කාලීන මාස 3 ආයෝජන

| ආයෝජන ආදායම | තැන්පතු අංකය | ආයෝජන දිනය | කල්පිරීම් දිනය | කාල සීමාව | පොළි අනුපාතය | ප්‍රමාණය | වසර තුළ ආයෝජන | දින ගණන | 2015 දී ලද පොළිය | 2014 සඳහා ලැබිය යුතු පොළිය | 2015 දී ලද ශුද්ධ පොළිය | 2015 සඳහා ලැබිය යුතු පොළිය | වෙනත් /ආපසු ගැනීම් | 2015.12.31 දිනට ආයෝජන (රු) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 086-6001-00006309-8 | 2015/12/20 | 2016/3/20 | මාස 3 | 5.50% | 2,789,133 | | 11 | 156,595 | 4,623 | 151,972 | 5,992 | - | 2,945,729 |
| | 086-6001-00006310-5 | 2015/12/20 | 2016/3/20 | මාස 3 | 5.50% | 2,789,133 | | 11 | 156,595 | 4,623 | 151,972 | 5,992 | - | 2,945,729 |
| | 086-6001-00006311-4 | 2015/12/21 | 2016/3/20 | මාස 3 | 5.50% | 2,789,133 | | 11 | 156,595 | 4,623 | 151,972 | 5,992 | - | 2,945,729 |
| | 086-6001-00006312-3 | 2015/12/20 | 2016/3/20 | මාස 3 | 5.50% | 1,394,567 | | 11 | 78,297 | 2,312 | 75,985 | 2,996 | - | 1,472,864 |
| | | | | | | **9,761,967** | | | **548,083** | **16,181** | **531,902** | **20,973,18** | **-** | **10,310,050** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**

**2015.12.31 දිනට නොපියවූ අත්තිකාරම් උපලේඛනය**

| දිනය | වව්චර් අංකය | විස්තරය | ප්‍රමාණය රුපියල්) |
|---|---|---|---|
| | | **ඉන්ධන -** | 90,000.00 |
| 2015/12/22 | 851 A | එච්. රෝහනධිර | 35,000.00 |
| 2015/12/28 | 852 A | එච්.රෝහනධීර | 45,000.00 |
| 2015/12/28 | 853 A | ඩබ්.කේ.කේ.රාජිකා නිලංගනී | 20,000.00 |
| | | එකතුව | **190,000.00** |

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/අයිඒආර්එස්/6/15/4 ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 30 දින

අධ්‍යක්ෂ,

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01</u>

ආයතනයේ සියලු වත්කම් හා වගකීම් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් විසිඑක්වන සියවසය සඳහා උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතිය යටතේ 2014 සහ 2015 වර්ෂවලදී ලැබී තිබුණු, ආයතනය විසින් තවදුරටත් භාවිතයට ගන්නා රු 6,102,110 ක් වටිනා ජංගම නොවන වත්කම් අයිතම 26 ක් ගිණුම්ගත කර නොතිබුණි. මෙම අයිතම ස්ථාවර වත්කම් ලේඛනය තුළද ඇතුළත් කර නොතිබුණි.

(ආ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07</u>

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු 693,065 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය වෙත විදුලිය ලබා ගැනීමේදී විදුලි ට්‍රාන්ස්ෆෝමරයක් සවිකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත 2014 අගෝස්තු 19 දින රු.2,598,600 ක් ගෙවා තිබූ අතර ට්‍රාන්ස්ෆෝමරයේ සිට නේවාසිකාගාරය වෙත හා පරිපාලන ගොඩනැගිලි වෙත විදුලිය සම්ප්‍රේෂණය සඳහා 2015 පෙබරවාරි 05 දින රු 2,594,145 ක වියදම් දරා තිබුණි. එකම කාර්යයක් සඳහා ගෙවන ලද මෙම වියදම් කාණ්ඩ 2 න් විදුලිබල මණ්ඩලයට ගෙවූ මුදල

විලම්භිත අයභාර වියදමක් ලෙස හඳුනාගෙන අවුරුදු 10 ක් තුළ ලාභයට එරෙහිව ලියා හැරීමට තීරණය කර තිබූ නමුත් සම්ප්‍රේෂණ වියදම ජංගම නොවන වත්කමක් ලෙස හඳුනාගෙන සියයට 20 බැගින් ක්ෂය කර තිබුණි. මේ අනුව එකම කාර්යයක් වෙනුවෙන් දැරූ වියදම් ගිණුම් ප්‍රතිපත්ති 2 ක් භාවිතා කර ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008,2009 සහ 2010 වර්ෂයන්හි මිලදී ගත් රු.240,520 ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධයෙන් අනුගමනය කළ ක්ෂය ප්‍රතිපත්තිය අනුව 2015 දෙසැම්බර් 31 දිනට, එහි වටිනාකම් ශුන්‍ය විය යුතු නමුත් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ශුද්ධ වටිනාකම රු 21,759 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ආ) කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාවේ 17 වන හා 16 වන අදියරයන්හි පාඨමාලාව හදාරන ශිෂ්‍යයන් 25 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.187,500 ක්වූ පාඨමාලා ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ආයතනය විසින් පවත්වාගෙන යන තොග ලේඛනයන්ට අනුව ඉතිරි කෙසෙල් පැල ප්‍රමාණය 39650 ක් වුවත් භෞතික තොග පරීක්ෂාවට අනුව එම අගය 38650 ක් වුයෙන් රු 60,760 ක් වටිනා කෙසෙල් පැල 1000 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු ශේෂ

ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන මඟින් ගොවීන් තුන්දෙනෙකුට 2012 වර්ෂයේ දී ලබාදී තිබුණු ණය මුදලින් රු 83,800 ක හිඟ ණය වාරික අයකර ගැනීමට ආයතනය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 138 හා 139 | වවුචරයක් සහතික කිරීමේදී හා ගෙවීම් කිරීමේදී අදාළ වවුචර් සියළු අතින්ම සම්පූර්ණ වීම හා විධිමත් කුවිතාන්සියකින් ගෙවීම තහවුරු කර ගත යුතු වුවත්, පුවත්පත් දැන්වීමක් පළකිරීමට අදාළව හා අන්තර් ජාතික වැඩමුළුවකට අදාලව වැය බිල්පත් නොමැතිව එකතුව රු.207,654 ක අත්තිකාරම් පියවීම් වවුචර් සහතික කර තිබුණි. |
| මුදල් රෙගුලාසි 371 | **(i)** අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත අවස්ථා 69 කදී එකතු වටිනාකම රු.2,487,240 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| | **(ii)** අදාල කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 44 ක දී ලබාගෙන තිබු එකතුව රු.1,853,487 ක අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 237 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවත් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනි ලෙස අවස්ථා දෙකකදී රු.110,000 සිට රු.170,637 දක්වා පරාසයක් තුළ අත්තිකාරම් ලබා දී තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පාඨමාලාවෙහි 16 වැනි අදියරෙහි වූ ගොවි පුහුණු වැඩසටහන සඳහා 2015 අප්‍රේල් සිට සැප්තැම්බර් අතර කාලය තුළ බාහිර පුද්ගලයකුගේ අක්කර 2 ½ ක කුඹුරක් යොදාගෙන තිබුණ ද කුඹුර ලබා ගැනීමට හා වියදම් දැරීමට කළමනාකරණ මණ්ඩලයෙහි අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.5,991,049 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,789,001 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,780,050 ක වර්ධනයක් සිදුවී තිබුණි. රජයේ ප්‍රදාන රු.12,000,000කින් වැඩිවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් සිදු වී තිබූ අතර 2014 වර්ෂයේ ඌනතාවයක් හා 2015 වර්ෂයේ අතිරික්තයක්ද ඇති වී තිබුණි.කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණද පිළිවෙලින් රු.14,477,841ක් , රු.10,995,932 ක් හා රු.34,603,218 ක් විය. 2014 වර්ෂයේදී දායකත්වය පිරිහී තිබුණි. නමුත් 2015 වර්ෂයේදී එය සියයට 215 කින් වර්ධනය වී රු.34,603,218 ක් වී තිබුණි.

### 3.2 විග්‍රාහාත්මක සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2015 වර්ෂයේ ආයතනයේ ජංගම අනුපාතය 90:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය 61.3:1 ක් විය. මෙසේ ජංගම අනුපාතය ඉහළ අගයක් පෙන්නුම් කළ ද වත්කම්වලින් සියයට 92 ක් නියෝජනය කරනුයේ බැංකු ශේෂයෙනි. ඒ අනුව ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවාගෙන තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2008 අංක 2 දරන කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව කෘෂිකර්ම හා කෘෂි තාක්ෂණයේ සහ කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යා මූලිකාංග පිළිබඳ උසස් අධ්‍යාපනයේ දැනට යෙදී සිටින තැනැත්තන් සඳහා උසස් අධ්‍යාපනය ලබාදීම, ප්‍රවර්ධනය සහ වර්ධනය කිරීම ප්‍රධාන අරමුණ විය.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපාධි පාඨමාලාව, ඩිප්ලෝමා අදියර, උසස් ඩිප්ලෝමා අදියර හා උපාධි අදියර ලෙස අදියර තුනකින් සමන්විත වන අතර පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 44 සිට සියයට 75 දක්වා ප්‍රතිශතයක් ඩිප්ලෝමා අදියර සම්පූර්ණ කිරීමකින් තොරව පාඨමාලාව අතහැර ගොස් තිබුණි. තවද උපාධි අදියරේ අවසන් ව්‍යාපෘතිය දක්වා අධ්‍යයන කටයුතු වල නිරත වන ශිෂ්‍ය සංඛ්‍යාව මුලින් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 17 - සියයට 23 අතර සුළු පිරිසක් බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යන කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාවෙහි අධ්‍යයන කාල සීමාව අවුරුදු 4 මාස 6 ක් වුවත් 2009 වර්ෂයෙහි උපාධි පාඨමාලාව සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවාගෙන අවුරුදු 7 ½ ක් ගතවී ඇතත් පාඨමාලාව අවසන් කර නොතිබුණි.

(ඇ) උපාධි පාඨමාලාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රායෝගික ගොවි පුහුණු වැඩසටහන (Farm Practice) සඳහා ආයතනය වෙත කුඹුරක් අත්‍යාවශ්‍යව පැවතියද කුඹුරක් ස්ථිරව ආයතනය වෙත ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබූ අතර 2016 වර්ෂයේ ගොවි පුහුණු වැඩසටහන සඳහා වගා කන්නයකට රු 6000 ක මුදලක් ගෙවා පර්චස් 1 ත් 2 ත් අතර ඉතා කුඩා කුඹුරක් ලබාගෙන තිබුණි.

(ඇ) විගණිත දිනය වන විට පටක රෝපණ කෙසෙල් පැල 41,000 කට අධික ප්‍රමාණයක් සඳහා සම්පූර්ණ කළ නොහැකි වූ ඇණවුම් පැවතිය දී හා ආයතනය වෙත කීර්තිනාමයක් ගොඩ නැගෙමින් තිබීය දී කෙසෙල් පැල නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට හා කෙසෙල් පැලයක නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

වර්ෂ කිහිපයකට ඉහතදී මිලදීගෙන කල් ඉකුත් වී තිබූ රු 109,662 ක් වටිනා රසායන ද්‍රව්‍ය තොගය , විධිමත් විමර්ශණයක් සිදු කිරීමකින් තොරව 2015 වර්ෂය තුළ විනාශ කර තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

තාක්ෂණික විෂය ධාරාව යටතේ උපාධි පාඨමාලා ආරම්භ කර නොතිබියදී 2014 ඔක්තෝබර් 18 දින සිට කාර්ය පැවරුම් මත ව්‍යාපෘති කළමණාකරුවකු බඳවාගෙන 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.225,000 ක් හා රු.320,000 ක දීමනා ගෙවා තිබුණි.

## 4.4 දෘෂ්‍ය අක්‍රමිකතා

ගොවි පුහුණු වැඩසටහන මගින් වගාකළ අක්කර 2 ½ ක වී වගාවෙන් කිසිදු අස්වැන්නක් හෝ අස්වැන්නට අදාල ආදායමක් ආයතනය වෙත ලැබී නොතිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

ගිණුම් වර්ෂය ආරම්භයේදී වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ රු 45,318,622ක ශේෂයක් පැවතිය දී  වර්ෂයේ ප්‍රාග්ධන වැයවීම් නිවැරදිව පුරෝකථනය නොකොට භාණ්ඩාගාරය තුළින් රු. 65,000,000ක ප්‍රාග්ධන ප්‍රදානයන් ලබාගෙන වර්ෂය තුළ රු. 14,437,654ක් පමණක් වැයකිරීම හේතුවෙන් රු. 95,880,968ක මුදලක් බැංකු ජංගම ගිණුමක ඌන උපයෝජිතව පැවතුණි.

## 4.6 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉදිකළ නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේරු.220,096,952 ක් වැයකර 2014 වර්ෂයේදී කාමර 100 කින් සමන්විත නේවාසිකාගාරයක් ඉදිකර තිබූ අතර 2014 – 2016 කාලය තුළ විභාග පැවැත්වෙන දිනවලදී පමණක් මෙම නේවාසිකාගාරයෙන් කාමර 4 ත් 8 ත් අතර ප්‍රමාණයක් පමණක් භාවිතයට ගෙන තිබුණි.

(ආ) ආයතනයෙහි අවශ්‍යතාවය හා අවශ්‍ය වන කාලය පිළිබඳව නිසි පුරෝකථනයකින් තොරව භාණ්ඩ මිලදී ගැනීම හේතුවෙන් රු 84,214 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර සඳහා භාවිතා කරන ටෝනර් 11ක් වර්ෂයකට අධික කාලයක සිට ගබඩා කර තිබුණි.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

පාඨමාලාවේ පළමු අදියර වූ ඩිප්ලෝමා අදියර සමත් වූ දෙවන හා තෙවන ශිෂ්‍ය කණ්ඩායම්වල ශිෂ්‍යයන් 53 දෙනෙකු වෙත සහතික පත්‍ර ප්‍රදානය සඳහා ආයතනයෙහි ශ්‍රවනාගාරය භාවිතා කළ හැකිව තිබියදී හම්බන්තොට අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාව යොදාගැනීම වෙනුවෙන් රු. 350,000 ක මුදලක් වැය කර තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරු 12 න් තනතුරු 8 ක් ගිණුම් වර්ෂය අවසාන දින වනවිටත් පුරප්පාඩුව පවතින අතර පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු නොකොට උසස් අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියකින් තොරව කාර්ය පැවරුම් පදනම මත සේවකයින් 28 දෙනෙකු බඳවාගෙන තිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්මට අනුව 2015 වර්ෂය තුළදී කෘෂි තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 175 දෙනෙකු බඳවා ගැනීමට හා හොඳ තත්ත්වයේ පටක රෝපණ කෙසෙල් පැල 240,000 ක් නිෂ්පාදනය කිරීමට සැලැසුම් කර තිබුණද බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 118 ක් හා නිෂ්පාදනය කල කෙසෙල් පැල සංඛ්‍යාව 185038 ක් විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මෙහෙයුම් පාලනය | බඳවාගන්නා සිසුන් පාඨමාලාව අවසානය දක්වා රඳවා ගැනීමට සුදුසු ක්‍රමවේද හඳුන්වා නොදීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ලේඛන යාවත්කාලීන නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී නොගැනීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

## 2015 විගණන වාර්තාවේ විගණන විමසුම් සඳහා පිළිතුරු

## කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

| විගණන වාර්තාවේ ඡේද අංකය | විගණන විමසුමෙහි සඳහන් කරුණු | පිළිතුර |
|---|---|---|
| 2.2.1 | **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති**<br><br>අ) ආයතනයේ සියලු වත්කම් හා වගකීම් සාධාරණ අගයට මුල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් විසි එක්වන සියවසය සඳහා උසස් අධ්‍යාපනය (HETC) ව්‍යාපෘතිය යටතේ 2014 සහ 2015 වර්ෂ වලදී ලැබී තිබුණු ආයතනය විසින් තව දුරටත් භාවිතයට ගන්නා රු.6,102,110ක් වටිනා ජංගම නොවන වත්කම් අයිතම 26 ක් ගිණුම් ගත කර නොතිබුණි. මෙම අයිතම ස්ථාවර වත්කම් ලේඛනය තුලද ඇතුලත් කර නොතිබුණි. | මෙම වත්කම් මේ වන විට ආයතනයේ පොත් වලට ඇතුලත් කර ඇත. |
| | ආ ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරිම හේතුවෙන් පිරිවැය රු.693,065 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරිමට කටයුතු කර නොතිබිනි. | මෙහි දක්වා ඇති වත්කම් නිසි පරිදි හදුනාගෙන ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් 2016 වර්ෂය සඳහා අවසාන ගිණුම් සකස් කිරිමේදි ඇතුලත් කර නිවැරදි කිරිමට කටයුතු කර ඇත. |
| 2.2.2 | **ගිණුම්කරණ ප්‍රතිපත්ති**<br><br>ආයතනය වෙත විදුලිය ලබා ගැනිමේදී විදුලි ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරිම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙත 2014 අගෝස්තු 19 වන දින රු.2,598,600ක් ගෙවා තිබූ අතර ට්‍රාන්ස්ෆෝමරයේ සිට නේවාසිකාගාරය වෙත හා පරිපාලන ගොඩනැගිලි වෙත විදුලිය සම්ප්‍රේශණය සඳහා 2015 පෙබරවාරි 5 දින රු. 2,594,145ක වියදම් දරා තිබුණි. එකම කාර්යයක් සඳහා ගෙවන ලද මෙම වියදම් කාණ්ඩ දෙකෙන් විදුලි බල මණ්ඩලයට ගෙවූ මුදල විලම්භිත අයභාර වියදමක් ලෙස හදුනා ගෙන අවුරුදු 10ක් තුල ලාභයට එරෙහිව ලියා හැරිමට තිරණය කර තිබූ නමුත් සම්ප්‍රේශන වියදම ජංගම නොවන වත්කමක් ලෙස හදුනා ගෙන සියයට විස්ස බැගින් ක්ෂය කර තිබිනි. මේ අනුව එකම කාර්යයක් වෙනුවෙන් දැරූ වියදම් ගිණුම් ප්‍රතිපත්ති දෙකක් භාවිතා කර ගිණුම් ගත කර තිබූ බව නිරික්ෂණය විය. | 2016 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරිමේදි මෙම වරද නිවැරදි කිරිමට කටයුතු කර ඇත. |
| 2.2.3 | **ගිණුම්කරණ අඩුපාඩු**<br><br>අ) 2008 2009 සහ 2010 වර්ෂයන්හි මිලදී ගත් රු. 240,520 ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධයෙන් අනුගමනය කළ ක්ෂය ප්‍රතිපත්තිය අනුව 2015 | 2016 අවසාන ගිණුම් සකස් කරන විට නිවැරදි කර ඇත. |

| | | |
|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට, එහි වටිනාකම ශුන්‍ය විය නමුත් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් ශුද්ධ වටිනාකම රු.21,759 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | |
| | ආ ) කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාවේ 17 වන හා 16 වන අදියරයන්හි පාඨමාලාව හදාරන ශිෂ්‍යයන් 25 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.187,500 ක් වූ පාඨමාලා ගාස්තු ගිණුම් ගතකර නොතිබුණි. | 2016 සංශෝධිත අවසාන ගිණුම් සකස් කරන විට නිවැරදි කරමි |
| 2.2.4 | **පැහැදිලි නොකල වෙනස්කම්**<br>ආයතනය විසින් පවත්වා ගෙන යන තොග ලේඛනයන්ට අනුව ඉතිරි කෙසෙල් පැළ ප්‍රමාණය 39650ක් වුවත් භෞතික තොග පරික්ෂාවට අනුව එම අගය 38650ක් වුයෙන් රු.60760/- වටිනා කෙසෙල් පැළ 1000ක වෙනසක් නිරික්ෂණය විය. | මේ ආකාරයේ වෙනසක් ආයතනයේ පැළ සම්බන්ධව පවත්වාගෙන යන පොත් වලට අනුව දැකිය නොහැකිය. වැඩි දුරටත් පටක රෝපිත කෙසෙල් පැළ අංශයේ පර්යේෂණ සහකාරවරයා විසින් සකස් කරන ලද වාර්තාවක් විගණන අධිකාරි වෙත ඉදිරිපත් කර ඇත. |
| 2.3 | **ලැබිය යුතු ශේෂ**<br>ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන මගින් ගොවීන් තුන් දෙනෙකුට 2012 වර්ෂයේදි ලබාදි තිබුන ණය මුදලින් රු.83800ක හිග ණය වාරික අය කර ගැනීමට ආයතනය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම හිග ණය මුදල් අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග දියත් කර ඇත. |
| 2.4 | **නීති රීති, රගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම.** | |
| | **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | **මුදල් රෙගුලාසි 138 හා 139**<br>වවුචරයක් සහතික කිරිමේදී හා ගෙවීම් කිරිමේදි අදාල වවුචර් සියළු අතින්ම සම්පූර්ණ වීම හා විධිමත් කුවිතාන්සියකින් ගෙවීම තහවුරු කර ගත යුතු වුවත් පුවත්පත් දැන්වීමක් පළ කිරිමට අදාල ව වැය බිල්පත් නොමැතිව එකතුව රු.207654/- ක අත්තිකාරම් පියවීම් වවුචර් සහතික කර තිබුණි. | මෙම බිල්පත් අදාල ආයතන වලින් ලබාගෙන විගණන අධිකාරි වෙත ඉදිරිපත් කර ඇත. |
| | **මුදල් රෙගුලාසි 371**<br>(i) අත්තිකාරමක් ලබා දීම හුදෙක් මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත අවස්ථා 69කදී එකතු වටිනාකම රු.2,487,240 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | මෙම ආයතනයේ මාණ්ඩලික නිළධාරින් වශයෙන් සැලකිය හැක්කේ සහකාර මුල්‍යාධිකාරි සහ සහකාර ලේඛකාධිකාරි පමණි. එමෙන්ම මෙම ආයතනයට මුදල් අයකැමි වරයෙක්ද නොමැති බැවින් සුළු මුදල් හැරුනකොට ආයතනයේ අත ඉතිරි මුදලක් නොමැත. අධ්‍යයන අංශය සඳහා විවිධ වැඩමුලු, අධ්‍යයන චාරිකා, සහ ගොවිපොල පුහුණු වැඩසටහන් සඳහා මුදල් අවශ්‍ය වන අවස්ථාවන්හිදි විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි අත්තිකාරම් ලබා දී ඇත. විගණන අධිකාරි තුමා සමග සාකච්ඡා කිරිමෙන් අනතුරුව මෙසේ අත්තිකාරම් ලබා දීම |

| | | |
|---|---|---|
| | | අවම කර ඇත |
| | (ii) අදාල කාර්යය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 44කදී ලබාගෙන තිබූ එකතුව රු.1853487 ක අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 237 දක්වා කාලයක් ප්‍රමාදවී තිබුණි. | අත්තිකාරම් ලේඛනය පරිශීලනය කිරීමෙන් අනතුරුව අත්තිකාරම් පියවීමක් සඳහා ලබා ගත් උපරිම දින ගණන දින 160 ක් වන අතර එසේ දීර්ඝ කාලයක් ගතවූ අත්තිකාරම් නොපියවීමට හේතුව වී ඇත්තේ කුකුලුන් සඳහා තාවකාලික ගෘහයක් ඉදි කිරීමට ලබා දුන් අත්තිකාරමක් වීම හේතුවෙනි. කෙසේ වුවද ඉදිරියට ලබා දෙන අත්තිකාරම් පියවීම සඳහා වැඩ කරන දින 14කට නොවැඩි කාලයක් පමණක් ලබා දීමට කටයුතු කරමි. |
| | **(ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | |
| | වරකට ලබා දිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000ක් වුවත් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනි ලෙස අවස්ථා දෙකකදී රු.110,000 සිට රු.170,637 දක්වා පරාසයක් තුල අත්තිකාරම් ලබා දී තිබුණි. | ආයතනයේ කාර්යයන් කරගෙන යාම සඳහා ඇතිවූ අවශ්‍යතා මත අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය සහිතව මෙම අනුමැතිය සහිතව මෙම අත්තිකාරම් ලබාදී ඇත. |
| 2.5 | **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**<br><br>පාඨමාලාවෙහි 16 වැනි අදියරෙහි වූ ගොවි පුහුණු වැඩසටහන සඳහා 2015 අප්‍රේල් සිට සැප්තැම්බර් අතර කාලය තුල බාහිර පුද්ගලයෙකුගේ අක්කර 2 ½ ක කුඹුරක් යොදා ගෙන තිබුණද කුඹුර ලබා ගැනීමට හා වියදම් දැරීමට කළමනාකරණ මණ්ඩලයෙහි අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කුඹුර ලබා ගැනීම සඳහා ගොවි මහතා විසින් ලබා දී තිබූ ලිපිය අධ්‍යක්ෂතුමාගේ අනුමැතියට ඉදිරිපත් කළ අතර මේ ආකාරයෙන් කුඹුරක් ලබා ගැනීමට බදු ඔප්පුවක් සකස් කළ යුතුව තිබුණි. ඒ සඳහා දිගු කාලයක් ගත වන බැවින් හා බදු ඔප්පු සකස් කිරිමකින් තොරව ආයතනය මගින් බදු මුදල් ගෙවීමට නොහැකි බැවින් කුඹුර ලබා ගැනිමට දිගු කාලයක් ගත වන බව දන්වන ලදී. ගොවිපල පාඨමාලාව තීරණාත්මක හා නියමිත කාලයට සිදු කල යුතුවූ අතර (මෙම ප්‍රදේශයේ වතුර ලබා දෙනුයේ කන්න ක්‍රමය පදනම් කරගෙන නිසා අදාල කන්නයට අනුව වගා කටයුතු සිදු කල යුතු බැවින්) ඉතා ඉක්මණින් කටයුතු සම්පාදනය කිරිමට සිදු විය. මෙය සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරමක් බැවින් කුඹුරට අලාභ හානි සිදු විය හැකි නිසා කුඹුරු ඉඩමක් සොයා ගැනිමට ඉතා අපහසු විය.ඉහත කරුණු නිසා ගොවිපොළ පුහුණුවේ මඩ ගොවිතැන නතර කිරිමට තිරණය කල අවස්ථාවේ අධ්‍යක්ෂතුමාගේ වාචික අවසරය මත ප්‍රදේශයේ ගොවි මහතකුගෙන් කුඹුරක් ලබා ගැනිමට සිදු විය. ඊට අදාල යෙදවුම් සඳහා ඉල්ලුම් කල ලිපියට හා අත්තිකාරම් මුදල සඳහා අධ්‍යක්ෂතුමාගේ ලිඛිත අවසරය ලබා දි ඇති අතර පරිපාලන අංශය ඒ සම්බන්ධව ලිඛිතව දැනුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** | |
| 4.1 | **කාර්යසාධනය**<br><br>(අ)උපාධි පාඨමාලාව, ඩිප්ලෝමා අදියර, උසස් ඩිප්ලෝමා අදියර හා උපාධි අදියර ලෙස අදියර තුනකින් සමන්විත වන අතර පාඨමාලාව සඳහා ලියාපදිංචි වි ඇති ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 44 සිට දියයට 75 දක්වා ප්‍රතිශතයක් ඩිප්ලෝමා අදියර සම්පූර්ණ කිරිමකින් තොරව පාඨමාලාව අතහැර ගොස් තිබුනි. තවද, උපාධි අදියරේ අවසන් ව්‍යාපෘතිය දක්වා අධ්‍යයන කටයුතු වල නිරත වන ශිෂ්‍ය සංඛ්‍යාව මුලින් බදවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 17-සියයට 23ත් අතර සුළු පිරිසක් බව නිරික්ෂණය විය. | ඩිප්ලෝමා පාඨමාලාව අවසන් වීමට ප්‍රථම ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවීමට බලපාන සාධක ලෙස පාඨමාලා ගාස්තු ගෙවීමට අපහසු වීම, ප්‍රායෝගික හා ක්ෂේත්‍ර වැඩසටහන් සඳහා සහභාගී වීමට ඇති අපහසුව, ආයතනය සතුව අත්‍යවශ්‍යය පහසුකම් නොමැතිකම හා තම පෞද්ගලික කාරණා දැක්විය හැකිය.<br><br>උපාධි පාඨමාලාවට ඇතුලත් වීම සඳහා ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා සමත්ව සාධන මට්ටමක් ලබා ගත යුතු බැවින් උපාධි පාඨමාලාවට යාමේ දී ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම සිදුවේ. |
| | ආ ) ආයතනය විසින් පවත්වාගෙන යන කෘෂි තාක්ෂණ උපාධි පාඨමාලාව හි අධ්‍යයන කාල සීමාව අවුරුදු 4යි මාස 6ක් වුවත් 2009 වර්ෂයෙහි උපාධි පාඨමාලාව සඳහා පලමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගෙන අවුරුදු 7 1/2 ක් ගතවී ඇතත් පාඨමාලාව අවසන් කර නොතිබුණි. | උපාධි පාඨමාලාව හදාරනුයේ කෘෂි කර්මාන්තයේ නියැලෙන පිරිසක් වන අතර විශ්ව විද්‍යාලයට ඇතුලත් වන අනෙකුත් ශිෂ්‍යයන් ගෙන් ඔවුන් වෙනස් වෙති. එම නිසා ඔවුන්ට අධ්‍යාපනය හා තාක්ෂණය ලබා දීමේදී ඔවුන්ගේ දැනුම් මට්ටම් හා අවබෝධ කර ගැනීමේ හැකියාව ගැන සැලකිලිමත් වීමට සිදුවිය. සැලසුම් කල කාලය තුල අවසන් කිරිමට හැකි වුවා නම් ඔවුන්ට අවශ්‍ය විශය කරුණු සියලුදේ නොලැබී යාමට ඉඩ තිබුණි. එමෙන්ම පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමට නොහැකි වීමටද ඉඩ තිබුණි. එමෙන්ම 2009 දී මෙම පාඨමාලාව ආරම්භ කරන විට ආයතනය තුල ඉතා අවම පහසුකම් හා ආචාර්ය මණ්ඩලය සිටියේ එක් අයකුපමණි. ඉන්පසුවද පාඨමාලව සිදුකලේ ඉතා අඩු ආචාර්ය මණ්ඩලයක සහභාගිත්වයෙනි. 2013 වන තුරු කිසිම ස්ථිර කථිකාචාර්යවරයෙක් නොසිටි අතර 2014 එක් කථිකාචාර්යවරයෙක් පමණක් බඳවා ගත් අතර 2016 වනතුරු තාවකාලික පදනම මත සේවය කරන ආචාර්ය මණ්ඩලයක් මගින් මෙය පවත්වා ගන යනු ලබයි. තවද, ක්‍රියාත්මක කරන පළමු අවස්ථාව මෙය බැවින්ද විශාල ප්‍රායෝගික ගැටලු රාශියකට මුහුණ පෑමට සිදු විය.එම නිසා සැප්තැම්බර් මාසය වන විට යොමුකර ඇති අතර නියමිත පරිසාධන මට්ටමට ලගා වීමට නොහැකිවූ බැවින් පර්යේෂණය අවසන් කරන ලද්දේ 2016 වර්ෂයේදිය.2016 ජුලි මස 10 වන දින පර්යේෂණයේ අවසන් විභාගය පවත්වා උපාධි පාඨමාලාව අවසන් කිරිමට කටයුතු සම්පාදනය කර ඇත.දැනට පවතින විශය මාලාවට අනුව විෂය මාලාව සම්පූර්ණ කිරිමට සැලසුම් කල |

| | | |
|---|---|---|
| | | කාලය ප්‍රමාණවත් නොවන අතර ඒ ගැන සලකා බලා විෂය මාලා සංශෝධනයක් මේ වන විට සිදු කර ඇත. |
| | ඇ) උපාධි පාඨමාලාවේ අත්‍යවශ්‍ය අංගයක් වන ප්‍රායෝගික ගොවි පුහුණු වැඩසටහන (Farm Practice) සඳහා ආයතනය වෙත කුඹුරක් අත්‍යාවශ්‍යව පැවතියද කුඹුර ස්ථිරව ආයතනය වෙත ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබූ අතර 2016 වර්ෂයේ ගොවි පුහුණු වැඩසටහන සඳහා වගා කන්නයකට රු.6000ක මුදලක් ගෙවා පර්චස් 1ත් 2ත් අතර ඉතා කුඩා කුඹුරක් ලබා ගෙන තිබුනි. | ආයතනය සඳහා නීත්‍යානුකූලව හිමි වී ඇති අක්කර 50 ක ඉඩමෙන් අක්කර 40 ක ප්‍රමාණයක් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සීමාවේ පවතින නිසා එය නිදහස් කර ගැනීමට කටයුතු කරමින් සිටින අතර එය නිදහස් කර ගැනීමෙන් අනතුරුව ආයතනය සඳහා ස්ථිරව කුඹුරක් සකස් කිරීමට යෝජිතය. පාඨමාලාවේ ස්වභාවය අනුව නියමිත වගා කන්නය පසු වී ගොවි පුහුණු පාඨමාලාව ආරම්භ වන බැවින් කුඹුරක් බදු ක්‍රමයට ලබා ගැනීමට ද නොහැකි විය. එබැවින් 2016 වර්ෂයේ ගොවි පුහුණු වැඩසටහන සඳහා වගා කන්නයකට රු.6000ක මුදලක් ගෙවා පර්චස් 1ත් 2ත් අතර ඉතා කුඩා කුඹුරක් ලබා ගැනීමට සිදු විය. |
| | (ඈ) විගණිත දිනය වන විට සම්පූර්ණ නොකළ ඇණවුම් 41,000 කට අධික ප්‍රමාණයක් පැවතියදී හා පටක රෝපණ කෙසෙල් පැළ සඳහා ආයතනය වෙත කීර්තිනාමයක් ගොඩ නැගිමට තිබියදී කෙසෙල් පැළයක නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීමට හා කෙසෙල් පැළ නිෂ්පාදනය ඉහල නංවා ගැනීමට කිසිදු ඵලදායි ක්‍රියාමාර්ගයට යොමුවී නොමැත. | පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනයේදී නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීමට අනිවාර්යෙන්ම නිෂ්පාදනය ඉහල දැමිය යුතු වේ. නිෂ්පාදනය ඉහල නැංවීමට ඇති ප්‍රධානතම සීමාකාරි සාධකය වනුයේ විද්‍යාගාර ඉඩ පහසුකම් අවම වීමයි.මෙයට පිළියමක් වශයෙන් රු.මිලියන 150ක ඇස්තමේන්තුගත නව විද්‍යාගාරයක් ඉදි කිරිමට යෝජිතය (ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී). |
| 4.2 | **මෙහෙයුම් ක්‍රියාකාරකම්**<br>වර්ෂ කීපයකට ඉහතදී මිලදී ගෙන කල් ඉකුත්වී තිබූ රු.109662 ක් වටිනා රසායන ද්‍රව්‍ය තොගය, විධිමත් විමර්ශනයක් සිදු කිරිමකින් තොරව 2015 වර්ෂය තුල විනාශ කර තිබුණි. | මෙම රසායනික ද්‍රව්‍ය මිලදී ගෙන ඇත්තේ 2012 වර්ෂයට පෙර වන අතර ඒ වන විට මේ සම්බන්ධව කටයුතු කරන ලද නිලධාරින් ආයතනයේ දැනට සේවය නොකරන බැවින් විධිමත් විමර්ශනයක් සිදු කිරිමට නොහැක. එහෙත් පසුගිය වසර වල අවසන් ගිණුම් විගණනය කරන අවස්ථාවේ විගණන අධිකාරි විසින් දෙන ලද උපදෙස් වලට අනුව ආයතනය තුල සේවය කරන නිළධාරින් 03දෙනෙක්ගෙන් සමන්විත කමිටුවක් හමුවේ මෙම රසායනික ද්‍රව්‍ය විනාශ කිරිමට කටයුතු කරන ලදී. දැනට රසායනික ද්‍රව්‍ය මිලදී ගැනිමේදී නිසි ආකාරයෙන් පාලනයකට යටත්ව එම මිලදී ගැනීම් සිදු කිරිමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| 4.3 | **මතභේදයට තුඩුදුන් කරුණු**<br><br>තාක්ෂනික විෂය ධාරාව යටතේ උපාධි පාඨමාලා ආරම්භ කර නොතිබියදී 2014 ඔක්තෝබර් 18 දින සිට කාර්ය පැවරුම් මත ව්‍යාපෘති කළමනාකරුවෙකු බඳවා ගෙන 2014 හා 2015 වර්ෂ වලදී පිලිවෙලින් රු.225,000ක් හා රු.320,000 දීමනා ගෙවා තිබුණි. | තාක්ෂණික විෂය ධාරාව කඩිනමින් ආරම්භ කිරීම සඳහා, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හිටපු සභාපතිතුමියගේ නිර්දේශ මත ආයතනයේ අධ්‍යක්ෂ විසින් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත 2014.10.18 දින සිට මාස 06 ක කාලසීමාවක් සඳහා ව්‍යාපෘති කළමණාකරුවෙකු බඳවා ගත් අතර ඔහු විසින් සිදු කරන ලද පහත සඳහන් කාර්යයන් සඳහා ගෙවීම් සිදු කර ඇත.<br><br>• තාක්ෂනික විෂය ධාරාව සඳහා අධ්‍යයන ගොඩනැගිල්ල (දේශන ශාලා රසායනාගාර සහිතව),ආපන ශාලා යනාදිය ඉදි කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම (ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 517).<br>• තාක්ෂණික විෂය ධාරාව යටතේ උපාධි පාඨමාලාව 2016 කඩිනමින් ආරම්භ කිරීම සඳහා අර්ධ-ස්ථිර (Semi-Permanent)ගොඩනැ ගිලි ඉදි කිරීම සඳහා ලංසු ලේඛන සකස් කිරීම හා ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම ඇතුලුව සියලුම කටයුතු ඔහු විසින් සිදු කරන ලදි. කෙසේවෙතත් පසුව තාක්ෂණික විෂය ධාරාව මෙම ආයතනයෙන් කොළඹ විශ්ව විද්‍යාලයට ලබා ගැනීමෙන් පසු ලංසුකරුවකු තෝරාගෙන සිටියද එය අත්හිටුවන ලදි.<br>• ආයතනය සඳහා රු.මිලියන 150ක පටක රෝපණ විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම.<br>• ආයතනයට ප්‍රධාන සැලැස්මක් (Master Plan) නොමැති නිසා එය සකස් කිරීමට මොරටුව විශ්ව විද්‍යාලය සමඟ මූලික සාකච්ඡා පවත්වමින් ඊට අදාල මූලික වාර්තා සකස් කිරීමේ සියලු කටයුතු ඔහු විසින් අධීක්ෂණය කරන ලදි.<br>• ආයතනයේ දැනට පවතින විදාතා ගොඩනැගිල්ල දීර්ඝ කොට පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කොට ලංසු ලේඛන සකසා ලංසු කැඳවීම සහ ලංසු ඇගයීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කොට ලංසු කරුවෙකු තෝරා දී ඉදිකිරීමේ කටයුතු ඉංජිනේරුවරයා වශයෙන් සුපරීක්ෂා කිරීමේ කටයුතු ඔහු විසින් සිදු කරන ලදි. |

| | | |
|---|---|---|
| 4.4 | **දෘෂ්‍ය අක්‍රමිකතා**<br><br>ගොවි පුහුණු වැඩසටහන මගින් වගා කල අක්කර 2 ½ ක වී වගාවෙන් කිසිදු අස්වැන්නක් හෝ අස්වැන්නට අදාල ආදායමක් ආයතනයට ලැබී නොතිබුනි. | ගොවි පුහුණු වැඩසටහන ශිෂ්‍ය ප්‍රායෝගික ක්‍රියාකාරකමක් බැවින් ලාභ ලැබීමේ අරමුණක් නොමැත. අස්වැන්නෙන් ලද ආදායමෙන් ඊට අදාළ වියදම් පියවීම සඳහා (කුඹුරු හිමියාට ගෙවීම් ද ඇතුලත්ව) හිලව් කර ඇත. මේ සම්බන්ධයෙන් විගණන අධිකාරීගේ නිර්දේශ මත මූලික විමර්ශනයක් ස්වාධීන පාර්ශවයක් විසින් සිදු කර විමර්ශන වාර්තාව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව අස්වැන්න සම්බන්ධයෙන් කිසිදු අක්‍රමිකතාවක් සිදු වී නොමැත. ලද අස්වැන්න අදාළ වියදම් පියවීම සඳහා යොදා ගෙන ඇති බැවින් ආයතනයේ පොත් වල සටහන් වී නොමැත. |
| 4.5 | **අරමුදල් ඌන උපයෝජනය**<br><br>ගිණුම් වර්ෂය ආරම්භයේදී වැය නොවූ ප්‍රග්ධන ගිණුමේ රු.45,318,622 ක ශේෂයක් පැවතියදී වර්ෂයේ ප්‍රාග්ධන වැයවීම් නිවැරදිව පුරෝකථනය නොකොට භාණ්ඩාගාරය තුලින් රු.65,000,000 ක ප්‍රාග්ධන ප්‍රධානයන් ලබාගෙන වර්ෂය තුළ රු.14,437,654 ක් පමණක් වැය කිරීම හේතුවෙන් රු.95,880,968 ක මුදලක් බැංකු ජංගම ගිණුමක ඌණ උපයෝජිතව පැවතුණි. | 2016 වර්ෂය තුල තාක්ෂනික විෂය ධාරාවේ උපාධි පාඨමාලා පැවැත්වීමේ බලාපොරොත්තුවෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයද වැඩ කටයුතු කරගෙන යමින් පැවති අතර ඊට සමගාමීව ආයතනයේ තාක්ෂණික විෂය ධාරාව ආරම්භ කිරීම සඳහා නව ගොඩනැගිලි ඉදි කිරීමේ මූලික කටයුතු මෙන්ම, සියලුම ගොඩනැගිලි පුනරුත්තාපනය කර නැවත ඉදි කිරිමේ සැලසුමක් පැවතිනි. මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ බලාපොරොත්තුවෙන් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලබා ගැනීමට සිදු විය.කෙසේවෙතත්, 2016 ආරම්භ වීමත් සමඟ තාක්ෂණික විෂය ධාරාව කොළඹ විශ්ව විද්‍යාලයට ලබා ගැනීමෙන් ඉහත සැලසුම් කරන ලද කටයුතු අඩාල විය.<br><br>2016 වර්ෂය සහ 2017 වර්ෂය 2 ටම ලබා දී ඇත්තේ මිලියන 10 බැගින් පමණි. |
| 4.6 | **නිශ්ක්‍රීය හා ඌන උපයොජනය**<br><br>(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිකල නේවාසිකාගාර 60 ව්‍යාපෘතියෙන් කාමර 100 කින් සමන්විත නේවාසිකාගාරයක් රුපියල් මිලියන 219 කට අධික වියදමක් දරා ඉදි කර තිබූ අතර 2014 -2016 කාලය තුල විභාග පැවැත්වෙන දිනවලදි පමණක් මෙම නේවාසිකාගාරයෙන් කාමර 4ත් 8ත් අතර ප්‍රමාණයක් පමණක් භාවිතයට ගෙන තිබුණි. | නේවාසිකාගාර 60 ව්‍යාපෘතිය යටතේ මෙම ආයතනයේ එක් නේවාසිකාගාරයක් ඉදි කොට ඇත්තේ 2016 මෙම ආයතනය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ තාක්ෂණික විෂයධාරා උපාධි පාඨමාලා පැවැත්වීමේ කටයුතු සඳහාය. කෙසේ වෙතත් 2016 වර්ෂය ආරම්භ වීමත් සමඟ එම උපාධි පාඨමාලා පැවැත්වීම කොළඹ විශ්ව විද්‍යාලයට පවරා ගැනීමත් සමඟ මෙම නේවාසිකාගාරය ඉදි කරන ලද කාර්යය සඳහා යොදා ගැනීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| | | කෙසේ වෙතත් වර්තමානය වන විට අදාල නොවාසිකාගාරයේ කාමර 19 ක ප්‍රමාණයක් ලී බඩු සපයා ඇති අතර සිසුන් 76 කට එකවර නවාතැන් දීමට හැකිය. අනෙකුත් කාමර සඳහා ලී බඩු සපයා ගැනීමෙන් පසුව ඒවාද ප්‍රයෝජනවත් ලෙස භාවිත කළ හැකිය. ආයතනයේ දැනට පැවැත්වෙන කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාව දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ පැවැත්වෙන බැවින් ශිෂ්‍යයින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්, ආරාධිත විශේෂ දේශන, විභාග පැවැත්වෙන කාලසීමාවන්හිදී නේවාසිකාගාරයේ නවාතැන් ගනී. වර්තමානයේ ශිෂ්‍ය කණ්ඩායම වැඩි වීමත් සමග නේවාසිකාගාරය භාවිතය ද වැඩි වී ඇත. |
| | ආ) ආයතනයෙහි අවශ්‍යතාවය හා අවශ්‍ය වන කාලය පිලිබඳව නිසි පුරෝකථනයකින් තොරව භාණ්ඩ මිලදී ගැනීම හේතුවෙන් රු.84,214 ක් වටිනා ටෝනර් 11 වර්ෂයක්ට අධික කාලයක් සිට ගබඩා කර තිබුණි. | ආයතනයේ සෑම මාස 03කට වරක් විභාග කිහිපයක් පැවැත්වෙන බැවින් හා ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සෑම මාසයකම සිදු වන බැවින් ඒ සඳහා අදාල ප්‍රශ්න පත්‍ර හා පත්‍රිකා විශාල ප්‍රමාණයක් මුද්‍රණය කළ යුතුව තිබූ නිසා හම්බන්තොට ප්‍රදේශයට ටෝනර් ආදිය සැපයීමට සැපයුම් කරුවන් කාර්යක්ෂමව සිදු නොකරන නිසා මේ ආකාරයෙන් ටෝනර් මිලදී ගත්තේ ආයතනයේ වැඩ කටයුතු වලට හානියක් සිදු නොවීම සඳහාය. නමුත් 2015 සහ 2016 වර්ෂ වන විට අදාල ටෝනර් සැපයුම් කරුවන් සමග සාකච්චා කර මේ ආකාරයෙන් ටෝනර් ආදිය ගබඩා නොකර ක්ෂනිකව මිලදී ගැනීමට අදාල කටයුත් සිදු කර ඇත. |
| 4.7 | **ආර්ථික නොවූ ගනුදෙනු**<br><br>පාඨමාලාව පලමු අදියර වූ ඩිප්ලෝමා අදියර සමත්වූ දෙවන හා තෙවන ශිෂ්‍ය කණ්ඩායම් වල ශිෂ්‍යයන් 53 දෙනෙකු වෙත සහතික පත්‍ර ප්‍රදානය සඳහා ආයතනයෙහි ශ්‍රවනාගාරය භාවිතා කල හැකිව තිබියදී හම්බන්තොට අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාව යොදා ගැනිම වෙනුවෙන් රු.350,000 කට අධික මුදලක් වැය කර තිබුණි. | ඩිප්ලෝමාධාරීන් සඳහා ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය උත්සවාකාරයෙන් පැවැත්විය යුතු කටයුත්තකි. ඒ සඳහා ඉතාමත් අඩු පහසුකම් සහිත ආයතනයේ ශ්‍රවනාගාරය යොදා ගත නොහැක. පාඨමාලාවේ ගුණාත්මක අගය ආරක්ෂා කර ගැනීම සහ පාඨමාලාවට විශේෂ ප්‍රචාරණයක් ලබා දීමේ අරමුණු සහිතව හම්බන්තොට අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාව මෙම කාර්යය සඳහා යොදා ගෙන ඇත. |
| 4.8 | **කාර්ය මණ්ඩල පරිපාලනය**<br><br>ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුලත් තනතුරු 12න් තනතුරු 8ත් ගිණුම් වර්ෂය අවසාන දින | අනුමත තනතුරු 12න් පුරප්පාඩුව පවතින තනතුරු 8න් කථිකාචාර්ය තනතුරක් |

| | | |
|---|---|---|
| | වන විටත් පුරප්පාඩුව පවතින අතර පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු නොකොට උසස් අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියකින් තොරව කාර්ය පැවරුම් පදනම මත සේවකයින් 28 දෙනෙකු බඳවාගෙන තිබුණි. | 2016 මුල් භාගයේ පුරවා ඇත. එසේම ඉතිරි තනතුරු 07 න් තනතුරු 05ක් (කම්කරු-තනතුරු 03 ,ගොවිපල කළමණාකරු- 01 සහ පූර්ණ කාලීන සම්බන්ධීකාරක -01) කොන්ත්‍රාත් පදනම මත බැවින් ඒ සඳහා කොන්ත්‍රාත් වෙනුවට ස්ථිර තනතුරු ලබාදෙන මෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් සිදු කොට ඇත. පරිගණක යෙදුම් සහකාර තනතුරු 02 පිරවීමට මෙම වර්ෂය තුල කටයුතු කරමි. |
| 5. | **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය** | |
| 5.1 | **සංයුක්ත සැලැස්ම**<br><br>සංයුක්ත සැලැස්මට අනුව 2015 වර්ෂය තුලදී කෘෂි තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 175 දෙනෙකු බඳවා ගැනීමට හා හොඳ තත්වයේ පටක රෝපණ කෙසෙල් පැල 240,000 ක් නිශ්පාදනය කිරිමට සැලසුම් කර තිබුණද බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 118 ක් හා නිශ්පාදනය කල කෙසෙල් පැල සංඛ්‍යාව 185038ක් විය. | 2016 සහ 2017 වර්ෂ වලදී සංයුක්ත සැලැස්ම සංශෝධනය කර ලභා කර ගත හැකි ඉලක්ක පිහිටුවා එකී ඉලක්ක වලට යාම සඳහා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව කටයුතු කරමි. |
| 6 | **පද්ධති හා පාලනයන්**<br><br>විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂ වරයාගේ අවදානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවදානය යොමු විය යුතුය.<br><br>(අ) මෙහෙයුම් පාලනය<br><br>(ආ) ස්ථාවර වත්කම් පාලනය<br><br>(ඇ) තොග පාලනය<br><br>(ඈ) මූල්‍ය පාලනය | මෙම අංශ කෙරෙහි අවධානය යොමු කර නිවැරදි කිරිමට කටයුතු කරමි |